# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.
# මහා සභා රැස්වීම් වාර්තාව.
# 2019.01.17

වර්ෂ 2019 ක් වූ ජනවාරි මස 17 වැනි දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ජනවාරි මස මහා සභා රැස්වීම් වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද  මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රිනී ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රිනී පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රිනී ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා
22. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව සභා ලේකම් අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියළුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදි. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රථමයෙන්ම මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ලාට, ලේකම්තුමා ප්‍රධාන නිලධාරින්ට, ජනමාධ්‍යවේදීන් ඇතුළු සියලු දෙනාටම 2019 වසර සුභ නව වසරක් වේවායි මුලින්ම ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම මෙම වර්ෂයේදී සභාවේ ඉදිරි කටයුතු කරගෙන යන්න, ඒ වගේම බෝපෙ පෝද්දල ජනතාව වෙනුවෙන් ගිය වර්ෂයට වඩා වැඩි සේවයක් කරන්න සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගේ සහයෝගය බලාපොරොත්තු වෙනවා.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.**

01. 2018.12.18 දින පැවති මහා සභා වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතාවය හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2018.12.18 දින පැවති මහා සභා වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්. පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, 2018.12.18 දින පැවති මහා සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සම්මත කිරීමට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා** :- ගරු සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. උදාවුන නව වසර හැමෝටම සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා. ගිය සභා වාරයේදී අපි කමිටු පත්කර ගත්තා. කමිටු පත්කර ගත්තට ඒ කමිටු නීත්‍යානුකූල නෑ. හේතුව සභා ගර්භයේ නොහිටි මන්ත්‍රීවරයෙක් ඇතුලත් වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්.අබේකෝන් මැතිතුමා** :- ඒක බොහොම වගකීමෙන් කියනවා නීත්‍යානුකූලයි. අනිල් බන්දුතිලක මන්ත්‍රීතුමා එකඟ නැත්නම් එතුමට පුළුවන් ඉල්ලා අස්වෙන්න. ඒ ඇරෙන්න කමිටු නීත්‍යානුකූලයි. බොහොම වගකීමෙන් කියන්නේ. මම උපදෙස් අරන් තියෙන්නේ කමිටු නීත්‍යානුකූලයි. අනිල් බන්දුතිලක මන්ත්‍රීතුමා හිටියේ නෑ. නමුත් එහෙම පත්කර ගන්න පුළුවන්. එතුමට අද පුළුවන් එකඟ නැත්නම් ඉල්ලා අස්වෙන්න. ඔබතුමන්ලට පුළුවන් ඒ ගැන නීත්‍යානුකූල පියවර ගන්න. ඒ පිළිබඳ කිසිඳු ගැටලුවක් නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- අපේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණා ඉතා නිවැරදියි. ඒක නීත්‍යානුකූල වෙන්නේ නෑ. ඒ නිසා ගනිපු කිසිඳු තීරණ, තීන්දුවක් නීත්‍යානුකූල වෙන්නේ නෑ. ඒ ආකාරයට වැඩ කරොත් සභාවේ තියෙන වටිනාකම නැතිව යනවා. සභාවක නෙමෙයි මරණාධාර සමිතියකවත් එහෙම කරන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඔබතුමන්ලා ගන්න ක්‍රියාමාර්ගයක් ගන්න ඒකට. මම උපදෙස් අරන් ඉන්නේ ඒකට. ඔබතුමාලා වර්ජනය කරාට මම කමිටු තියන්න ඕනනේ. ඔබතුමාලා වර්ජනය කරනවා. කමිටුවට පත්වුන මන්ත්‍රීවරු ගැන. ඔහොම කතා කරනවා. මොකද්ද ඔබතුමාලගේ යෝජනාව, මොකද්ද ඔබතුමාලට වෙන්න ඕන. පත් වුන මන්ත්‍රීවරුන්ගේ නීත්‍යානුකූලභාවය හොයන්න කලින් ඔබතුමන්ලා පත් නොවුනේ ඇයි?.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී.යසරත්න මැතිතුමා** :- පත් නොවුන එක වැඩක් නෑ. නීත්‍යානුකූලව පත් කිරීමයි වැදගත්. එතුමට සභාවේ නිවාඩු අනුමත කරලා, එතුමගේ නම යෝජනා කරනවා කමිටුවලට පත් කරන්න කියලා. අපි කමිටු වලට විරුද්ධවීමක් නෙමෙයි තියෙන්නේ. පත්කිරීම් ක්‍රියාවලියට විරෝධතාවයක් ප්‍රකාශ කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- එහෙම කරන්න පුළුවන්. මම ඒකට උපදෙස් අරන් තියෙන්නේ. අනිල් බන්දුතිලක මන්ත්‍රීතුමාට පුළුවන් එතුමා කැමති නැත්නම් ඉල්ලා අස්වෙන්න. එච්චරයි. ඔබතුමාලා ගන්න ක්‍රියාමාර්ගයක් ගන්න එච්චරයි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** :- ගරු සභාපතිතුමනි, මාව කමිටුවට යෝජනා කරලා තියෙනවා. නමුත් පක්ෂය විසින් තීරණයක් අරන් තියෙනවා. මුදල් කමිටුවට සහභාගී වෙන්න එපා කියලා. ඒක ගැන මම තීරණයක් ලබා දෙන්නම් ඊළඟ සභාවේදී පක්ෂයත් එක්ක සාකච්ඡා කරලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඒ කියන්නේ ඔබතුමා ඉල්ලා අස්වෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා** :- ඉල්ලා අස්වෙනවද, සහභාගී නොවී ඉන්නවද කියලා දැනුම් දෙන්නම් ඊළඟ සභාවේදී.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- වැරදි හැඟීමක් මේ වාර්තාවලට යනවනේ. දැන් ඔබතුමා ඒක නීත්‍යානුකූල නෑ කියපු කතාව හමාර කරානම් ඉවරයිනේ. නමුත් දැන් ඔබතුමා කතා කරපු දේ මේ වාර්තාවට යනවනේ. කොච්චර නරක හැඟීමක්ද එන්නේ. අපි එදා බොහොම පැහැදිලිව කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඔබතුමා මට කියන්නේ නීත්‍යානුකූල නැහැයි කියලා යන්නද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- කතා කරාම අවස්ථාව දෙන්නකෝ සභාපතිතුමා. දැන් මේ තුන්වෙනි වතාවෙත් සභාවේ ඉන්නේ. අපි සභාව කඩාකප්පල් කරන්න ආවේ නෑ. ඒක හින්දා අපිට ඉඩදීලා යමු මේ සභාවේ තියෙන දේවල් සාකච්ඡා කරන්න. ඔබතුමා කියපු දේ යනවනේ මේ වාර්තාවට. ඔබතුමා මුලින්ම බොහොම ඉස්සර, මේ සභාවේදී නෙමෙයි පත් කරපු මුල් සභාවේදී කිවුවා මට ඕන විදියට තමයි පත්කරන්නේ කමිටු වලට කියලා. බොහොම පැහැදිලිව කිවුවා. අපි කිවුවා කොහොමත් ඒක කරන්න දෙන්නේ නෑ කියලා. අපි එදා දවසේ ආවේ පරණ තිබුණ විදියටම කමිටු පත්කර ගෙන යමු කියලා. අපි බොහොම පැහැදිලිව කිවුවා අපිට විරුද්ධ වීමේ අයිතිය තියෙනවා. සභාවට ඇවිල්ලා කමිටුවලට ඇවිල්ලා යම් යම් දේවල් වලට විරුද්ධ වෙන්න. ඒත් එකක් තියෙනවා අපි කොයි වෙලාවකවත් කමිටු වලට නැවිල්ලා ඉදලා නෑ. බොහොම පැහැදිලිව ඔබතුමා දන්නවා අන්තිම කාලේ ප්‍රජාතන්ත්‍රවිරෝධී වැඩක් වුනා නේ. අපි ඒකට මැදිහත් වුනා. අනිල්

බන්දුතිලක මන්ත්‍රීතුමා මේකට සහභාගී විම ගැන අපේ විරෝධතාවයක් නෑ. නමුත් මේක දිගින් දිගටම මෙහෙම වෙන්න ගියොත් මේක සභාවක් නෙමෙයි. ඒකයි ගරු සභාපතිතුමනි.

(ගරු උප සභාපති ජේ.ඒ.ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කියන්නේ මම කියන්න ඕන මේක නීත්‍යානුකූල නෑ කියලා. ඒකද කියන්න ඕන?.

මම වගකීමෙන් කියන්නේ ඒක නීත්‍යානුකූලයි. මම උපදෙස් අරන් ඉන්නේ. ඒක ඉවරයි. සභා වාර්තාවේ අඩුපාඩුකම් තියේනම් පෙන්වලා දෙන්න.

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්තටම මම වාර්තාව ගැන එච්චරම සන්තෝශයක් නෑ. මොකද මේකේ බොහොම වැඩක් නැති, කොහෙත්ම පාවිච්චි නොකරපු වචන දාලා. මේ වගේ වාර්තාවල් අපි දැක්කේ නෑ. මට පුළුවන් විදියට මම මේවා සංශෝධනය කරනවා. මේ වාර්තාව පිළිබඳ මගේ සන්තෝශයක් නෑ. පැහැදීමක් නෑ.

16 වන පිටුව

- "අපේ එකෙන් ජාතික පක්ෂයේ අය අයින් වෙනවා" ඒක "අපේ එක්සත් ජාතික පක්ෂයේ අය අයින් වෙනවා. " ලෙස සංශෝධනය විය යුතුයි.

මේක මම හිතන්නේ ලියන කෙනා මේක ටිකක් බලන්න. ඒක කොයිවෙලාවකවත් නොකියවෙන වචනයක් නෙමෙයි එක්සත් ජාතික පක්ෂය කියන එක. මෙවැනි සංශෝධන එන ඒවා එන්නේ හරස් විදියට. වැඩක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කිවුවේ නැද්ද එක්සත් ජාතික පක්ෂයේ කතාවක්.

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කිවුවා. එතන එක්සත් කියන එක නිවැරදි වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි.

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක මේ ලියන කෙනාට හිතන්නවත් බැරිද? දැන් සංශෝධන ඊළඟ එකේ දාන්නේ. මේකයි මිනිස්සු බලන්නේ. ඒකයි මේකේ තියෙන වැරැද්ද?. කොයි වෙලාවකවත් ජාතික පක්ෂය කියලා කියන්න යන්නෙ නැනේ. එක්සත් ජාතික පක්ෂය කියලනෙ කියන්නේ. මේවා හිතා මතා යන ඒවා මට තේරෙන්නේ.

22 පිටුව

- " මීට ඉස්සෙල්ලා දවසේ නෙමෙයි. දැන් යන්නේ කමිටුව පත් කරන්නනේ. දැන් ඔයගොල්ලන්ට දෙන්නෙක් ඉල්ලුවා. හරි නියෝජිතයින් දෙන්නෙක්ට දෙන්නම්. මොකද්ද දැන් තියෙන ප්‍රශ්නය."

ඉහත ප්‍රකාශය ගරු සභාපතිතුමා විසින් කරන ලද ප්‍රකාශයක් ලෙස සංශෝධනය විය යුතුයි.

මේ නම් මෙහෙම ඇතුලත් වෙන්නේ කොහොමද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැඩිපුර ඔබතුමානේ කතා කරන්නේ.

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ වාර්තාවේ වැඩිපුර කතා කරලා තියෙන්නේ මම නෙමෙයි. මේකේ ගොඩක් මන්ත්‍රීවරු කතා කරලා තියෙනවා කියාස් මන්ත්‍රීතුමන්ලා, අනෙක් මන්ත්‍රීවරුත් කතා කරලා තියෙනවා. මම බොහොම අඩුවෙන් කතා කරලා තියෙන්නේ මේ සභාවේ.

ඊළඟට " පෙර පාසල තියන්න කියන තැනක් තිබුනේ නෑ" ඒක "උළුවිටිකේ ජස්ටින් කන්ද පෙර පාසල තියන්න තැනක් තිබුනේ නෑ ඒ කාලේ " ලෙස සංශෝධනය විය යුතුයි.

34 පිටුව

- " මෙකේ අන්තිමට තියෙන්නේ අපි ඇවිල්ලා උර තියෙන එක විතරයි " ඒක "මේක අන්තිමට තියෙන්නේ අපි ඇවිල්ලා කුර තියෙන එක විතරයි " ලෙස සංශෝධනය විය යුතුයි.

ඒක දැන් මේ දෙවැනි වතාව. ඒක සිංහල භාෂාවේ එන මේවා එකක්.

65 පිටුව

- " ඊළඟට දහනායක හාඩ්වෙයාර් දැන් වැලි දාලා එතන ගොඩ කරන්න." ඒක "ඊළඟට දහනායක හාඩ්වෙයාර් දැන් වැලි දාලා එතන ගොඩ කරන්නේ. " ලෙස සංශෝධනය විය යුතුයි.

ගොඩ කරන්න කිවුවම මම ගොඩ කරන්න කිවුවා වගේ වෙනවා. අර්ථ දෙකක්. වචන ඉස්පිල්ලෙන්, පාපිල්ලෙන් යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බාගෙට වචන කියන හින්දද දන්නේ නෑ.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බාගෙට නෙමෙයි මම සම්පූර්ණ වචන කියන්නේ. ඔබතුමාගේ කාලේ විතරයි ඔහොම බාගෙට කිවුවයි කියන වචනේ කියන්නේ. මීට ඉස්සෙල්ලා වාර්තාවල් තියෙන්නේ බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඔබතුමාට රණ්ඩුවකට කිවුවා නෙමෙයි. ඔබතුමාගේ මෙහෙම දෙයක් තියෙනවා. හොඳට බලන්න. සමහර ඒවට එහේ, මෙහේ, අරක, මේක ඒවා කියනවා. එතකොට මේක ලියන කෙනා අරක කියන්නේ මොකද්ද, මේක කියන්නේ මොකද්ද, කියන එක හිතලා ලියන්න ඕන.

මෙතන මේ අකුරේ අඩුවක් තියෙනවා. " කරන්න " කියන එක "කරන්නේ" කියලා වෙනස් වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේවා බොහොම පැහැදිලිව මම තෝරලා බේරලා බලලා කියපු දේවල් මට හොඳට මතකයිනේ.

66 පිටුව

- " ඒගොල්ලන් ඩිසයින් එකක් බලලා නෙමෙයි දෙන්නේ." ඒක " ඒගොල්ලන් බලලා ඩිසයින් එකක් දෙන්න ඕන" ලෙස සංශෝධනය විය යුතුයි.

"සහතිකය ගේන්න ගියාම ඒ අය සහතිකය දෙනවා. ගිහිල්ලා බලලා නෙමෙයි දෙන්නේ. හරි නම් ඇවිල්ලා බලලා ජලය බැස යන්න හරියන ඩිසයින් එකක් දෙන්න ඕන." ඒක කියලා තියෙන්නේ.

ඉතාම නරක එකක් තියෙනවා. ඇත්තටම මිනිස්සු මේවා දැක්කම හොඳ නෑ. මට ටේප් එක තියෙනවා නම් දාලා පෙන්වන්න ඒකේ.

87 පිටුව

- " මෙතන දෙන්නෙක් ගහගන්න කොට පොලිස්කාරයෙක් ඉන්නවනම් ඌ යනවද අහක බලාගෙන." ඒක "මෙතන දෙන්නෙක් ගහගත්තා නම් පොලිස්කාරයෙක් ඉන්නවා නම් යනවද අහක බලාගෙන" ලෙස සංශෝධනය විය යුතුයි.

ඌ කියලා දාන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඌ කියලා කියවුනත් ඒක නොදා යුතුයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකත් ගරු මන්ත්‍රීතුමා කියලා නොකිවුවත් ඒක දාන්න ඕන. ඒක අපි මීට ඉස්සර සභා වල කතා කරලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තවත් සංශෝධන තියෙද?. පිළිගන්න ඕන කාරණා තියෙනවා. අඩුපාඩු නැත්තේ නෑ. නමුත් මම නම් කියන්නේ පහුගිය පාරවල් වල තිබුනට වැඩිය අඩුපාඩු අවමවීගෙන යනවා. අඩුපාඩුකම් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නරක සනයේ අඩුපාඩුකම් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දිගින් දිගටම මේ වාර්තාවේ ප්‍රශ්නය ඇවිල්ලා අපි කතා වුනා ස්ටැනෝ කෙනෙක් ගන්න. නමුත් එයා කියන්නේ මෙතනට එන්න බෑ මේකේ රෙකෝඩ්ය දෙන්න වාර්තාව හදලා දෙන්නම් කියලා. ඒ මට්ටමට අපිට යන්න බෑ. මෙතන කෙනෙක් ඉන්න ඕන. ඒක හින්දා අපි උපරිම උත්සාහ දරනවා අදාල නිලධාරියාගෙන් මේ වැඩේ කරගෙන යන්න. කොහොමත් ඉතින් අබේසේකර මන්ත්‍රීතුමා කියන්නේ මුලු වාර්තාවම හොඳ නෑ කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම අනිත් අයගේ ඒවා බලන්න යන්නේ නෑ. එතුමන්ලා බලනවද නැද්ද කියන එක මට අදාල නෑ. බැලුවහම පේනවා ඒවගෙත් අප්‍රබංශ තියෙන්නේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දකින්නේ ඇත්තටම වාර්තාව තවකෙනෙක් අකුරෙන් අකුර බලන මට්ටමට යන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්තටම වෙනදා ඔබතුමා හොඳටම දන්නවා මේක. අපිට සභා වාර්තාවල් බලන්න දානවා එක පැත්තකින්. හිටපු ලේකම්තුමිය බලන්නකො, ඒ ලේකම්තුමිය න,ණ,ල,ළ ඉඳන් බලනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මෙහෙම දෙයක් තියෙන්නේ. න්‍යාය පත්‍රයෙන් පිටත් යනවා අපි. මන්ත්‍රීවරයෙක් කතා කරන්න අවස්ථාව ඉල්ලුවම අපිට නොදී බෑ. න්‍යාය පත්‍රයෙන් ගොඩක් වෙලාවට පිට යන්නේ. ඔබතුමාට අනිත් සභා වල වාර්තා බලන්න පුළුවන්. අපි මේ වාර්තාවේ කතා කරපු දේවල් වලින් 99% දාන්න උත්සාහ කරනවා. අඩුපාඩුකම් වෙන්න පුළුවන්. මම කියන්නේ මේ තියෙන අඩුපාඩුකම් හදා ගන්න කියලා.

සංශෝධන වලට යටත්ව වාර්තාව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2018.12.18 දින පැවති මහා සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට ඒකමතිකව සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යටතේ මම කලින් අදහස් කල ආකාරයට 2019 වර්ෂයේ පළවෙනි සභා රැස්වීමට සහභාගී වන සියලුම මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කරගෙන යන්න සියලුම දෙනා පක්ෂ භේදයෙන් තොරව සහයෝගය ලබා දෙන්න. සභාපතිවරයා විදියට එම සහයෝගය මම ඉල්ලා සිටිනවා.

පෙර පාසල් ගොඩනැගිල්ල අපි අලුත් තැනකට ගෙනිච්චා. ඒ ගොඩනැගිල්ල අලුත්වැඩියා කරලා විවෘත කිරීම කරා. ඒ වගේම විශාල ඉල්ලුමක් තියෙනවා බෝපෙ පෝද්දල පෙර පාසලට ළමුන් ඇතුලත් කිරීමට. අපිට නමුත් ළමුන් බඳවා ගැනීම සීමා කරන්න වුනා එක ගුරුවරයෙක් නිසා ඉන්නේ. එතුමිය දැනට කම්කරු තනතුරක ඉන්නේ. අපි බලාපොරොත්තු වෙන්නේ මෙහේ තියෙන පෙරපාසල් පාලිකා තනතුරට එතුමියව අනියුක්ත කරන්න, ස්ථිර කර ගන්න. පෙර පාසලේ විශාල වැඩ කොටසක් ඉටු වුනා. ඒක සභාව ලබපු ජයග්‍රහණයක්. ඒ කලින් පෙර පාසල තිබුන තැන උප සභාපතිතුමාට හා මන්ත්‍රීවරුන්ට රැඳී ඉන්න ස්ථානයක් විදියට අලුත්වැඩියා කරලා ඉදිරියේදී ලබා දීමට කටයුතු කරනවා.

ඊළඟට අපේ අරමුණු වශයෙන් ගත්තම ආදාහනාගාරයක අඩුපාඩුවක් තියෙනවා. ඒක සඳහා පෝද්දල කන්දේ මැනුම් කටයුතු ආරම්භ කරනවා ළඟදීම. ප්‍රාදේශීය ලේකම්තුමා මිනින්දෝරු දෙපාර්තුමේන්තුවට යවලා ඒකේ මිනුම් කටයුතු මේ සතියෙම ආරම්භ කරයි. ඒකේදී අපිට ආදාහනාගාරයක් කෙසේ වෙතත් ඉඩමක් සම්පූර්ණයෙන් ප්‍රාදේශීය සභාවට පවරාගෙන සභාව සතු දේපලක් බවට පත්කරනවා.

ඒ වගේම අපි බලාපොරොත්තු වෙනවා ඒ ස්ථානයේ ආදාහනාගාරයක් ඉදිකරන්න. නමුත් එදා කියපු මතයේ මම අදත් ඉන්නවා. සිට්ට්‍රස් වත්තේ අක්කර පහක ප්‍රමාණයක් අපිට ලබා දෙනවා නම්, ඒ පිළිබඳව අපි කටයුතු කරන්න ලැස්තියි. ඉඩම් අමාත්‍යතුමා අපේ දිස්ත්‍රික්කයේ, ඉඩම් අධ්‍යක්ෂතුමන්ලා ඉන්නේ අපේ දිස්ත්‍රික්කයේ. ඉතින් ඒක තුල අපිට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් අපිට සහයෝගය ලබා දෙනවා නම් අපිට ආදාහනාගාරයක් කෙසේ වෙනත් වෙන වැඩකට හරි ඒ ඉඩම්

භාවිතා කරන්න පුළුවන් වෙයි ඉදිරියේදී. ඉතින් ආදාහනාගාරය පිළිබඳ අවශ්‍යතාවය තමයි මම මෙතනදී මතු කරේ. ඒක ගැන මන්ත්‍රීවරුන්ට අදහස් දක්වන්න පුළුවන් තමන්ගේ වෙලාව එනකොට.

අපිට තවත් අඩුපාඩුවක් තියෙනවා මේ ප්‍රදේශයට සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථානයක, සායනයක අඩුපාඩුවක් තියෙනවා. එතනදී ප්‍රධාන අමාත්‍යතුමාගේ මැදිහත්වීම මත මුදල් ලැබිලා අපේ තිබුන ආයුර්වේද ගොඩනැගිල්ල ඉවත් කරලා වැඩ කටයුතු ආරම්භ කරා. ඒ පිළිබඳව අපිට සුභවාදී බලාපොරොත්තුවක් තියෙන්නේ. ඒ ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අවසන් කරලා සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථානය ආරම්භ කරන්න පුළුවන් කියලා බලාපොරොත්තුවක් තියෙනවා.

ඒ වගේම වර්තමාන අපේ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඒකටත් ඇස්තමේන්තුව සකස් කරලා තියෙනවා තට්ටු තුනක ගොඩනැගිල්ලක්. කෝටි 12 ක මුදලක් වැය වෙනවා. සැලසුම් හා ඇස්තමේන්තු සකස් කරලා පළාත් පාලන ගරු අමාත්‍ය අපේ වජිර අබේවර්ධන මැතිතුමාට ලබා දීලා තියෙනවා. ඒකත් අපිට ලොකු දෙයක්. පළාත් පාලන අමාත්‍යතුමා ගාල්ල දිස්ත්‍රික්කය මහජන නියෝජිතයෙකු වීම. එතුමා පැවසුවා ඒකට අවශ්‍ය මුදල ලබා දෙන්න පුළුවන් කියලා. සුභවාදී බලාපොරොත්තුවක් තියෙනවා ඒ කාර්ය මේ වර්ෂයේදී ඉටුකරන්න පුළුවන් වෙයි කියලා.

ඒ වගේම කලේගාන පොළ ලැන්දැවේ තියෙන මහා බෝධි සමාගම සතු ඉඩමට ගෙනියලා එම භූමියේ තෙමහල් සාප්පු සංකීර්ණයක් සකස් කරන්න බලාපොරොත්තු වෙනවා. ඉතින් ඒක නම් ණය පහසුකම් යටතේ කරන්න බලාපොරොත්තු වෙනවා. ආදායම් උත්පාදනය කරන ව්‍යාපෘතියක් හින්දා. ඒකට දැනට අපි පස් සාම්පල පරීක්ෂණය තියලා, සැලසුම් සකස් කිරීමට දිස්ත්‍රික් ඉංජිනේරුතුමාට ලබා දීලා තියෙන්නේ. අපි ඉක්මනින් බලාපොරොත්තු වෙනවා ඒ වැඩ කොටස් ආරම්භ කරන්න මේ වර්ෂයේ.

ඒක තුල අපි දකිනවා බෝපෙ පෝද්දල ජනතාවට අවශ්‍ය සේවය බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවෙන් ඉෂ්ට කරන්න. අඩුපාඩුකම් තියෙන්න පුළුවන්. මොකද වර්තමාන තත්වය තුල, දේශපාලන අස්ථාවරභාවය තුල අඩුපාඩුකම් තියෙන්න පුළුවන්. අපිට කොයිවෙලාවකවත් ප්‍රාදේශීය සභාව දේශපාලනීකරණය නොවී බෝපෙ පෝද්දල ජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් මොකද්ද, ඒක කරන්න තමයි උප සභාපතිතුමා ප්‍රධාන මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලා සිටින්නේ. අපි එකතු වෙලා ජනතාවට අවශ්‍ය විදියට වැඩ කරමු කියලා ප්‍රකාශ කරන්න ඕන.

ඒ වගේම පවත්නා තත්වය යටතේ ඉදිරි කටයුතු කරගෙන යන්න සියලුම දෙනාගේ සහයෝගය අපේක්ෂා කරනවා.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවේ ඉදිරිපත් කිරීම.**

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- සභාපතිතුමනි, ඔබතුමා උරණ වෙන්න එපා. විරෝධාකල්පයක් නෙමෙයි. අවසාන වශයෙන් කියවුනා පක්ෂ භේදයකින් තොරව අපි ඉදිරි කාලයේදී වැඩ කරමු කියලා. අපි ප්‍රදේශයේ ජනතාවට වැඩ කරන්න ඕන. ඒක හොඳ අදහසක්. ඒකත් ඔලුවෙ තියාගෙන වැඩ කරන්න. අතීතය අමතක කරමින් හොඳ අනාගතයක් ගොඩනගන්න බෑ. ඒක නිසා මට ඔබතුමාට අතීතයේ පොඩි දෙයක් කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- සමාවෙන්න සියලුදෙනා. මට සභාව විනාඩි 05කට කල් තියෙනවා, හදිසි අවශ්‍යතාවයක්.

**(සභාව හදිසි අවස්ථාවක් මත විනාඩි 05 කට කල් තබන ලදි.)**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- සභාව විනාඩි 05 කට කල් තැබීම ගැන වචනයක් කතා කරන්න ඕන. කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලය අත්සතු කිරීමේ කාරණය යටතේ විරෝධතාකරුවන් කීප දෙනෙක් පහල පැමිණිලා සිටියා. මම සභාපතිවරයා වෙනකොට අදාල කාර්යය සඳහා සංවර්ධන බලපත්‍රය දීලා තිබුණා. මම සභාපති වුනාට පස්සේ සංවර්ධන බලපත්‍රය තාවකාලිකව අත්හිටෙව්වා. ඊට පස්සේ පරිසර සුරකීම් සංවිධානය මගින් නඩුවක් ගොනු කරලා තිබුණා. ඒ නඩුව ගාල්ල අධිකරණය ඉවතට දැම්මා. නමුත් දැනට කොළඹ අභියාචනා අධිකරණයේ නඩු පවරලා තියෙනවා. බොහොම පැහැදිලිව සභාපතිවරයා විදියට මම එතනදී ප්‍රකාශ කරා මගේ තියෙන බලතල අනුව ඒ දීපු මූලික සැලසුම් නිරාකරණය මත දීපු සංවර්ධන බලපත්‍රය අත්හිටුවීම දිගටම ක්‍රියාත්මක කරන්න. ඊයේ මම අපේ කාර්මික නිලධාරි යැව්වා. පැමිණිල්ලක් ඉදිරිපත් වුනා එයාලා ආයෙ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන නිසා. මම දැනුම් දුන්නා පහල ඉන්න විරෝධතාකරුවන්ට අධිකරණ නඩුව ඉදිරියේදී ඉවරවෙලා සලකලා බලනකම් ඒකට අවසර දෙන්නේ නෑ කියලා. ඒකට තමයි මම හදිසියේ විනාඩි 05 කට සභාව කල් තියන්න සිද්ධ වුනේ.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ හොඳ ප්‍රකාශයක් කරේ. අපි සභාවක් විදියට පක්ෂ භේදයකින් තොරව වැඩ කරමු කියලා. මම ඒකෙදී කියන්න ගියේ අතීතයේ කුණු හාර අවුස්සවලා පොඩි රසයක් විඳින්න නෙමෙයි. නමුත් එකක් තියෙනවා වෙච්ච දේවල් නිවැරදි වෙන්න නම්, අපිට පහුගිය කාලේ සිද්ධ වුනා උත්සව අවස්ථාවල්, බොහොම වැදගත් අවස්ථාවල් මග අරින්න. ඒකට බොහොම සාධාරණ හේතු තිබුණා. මම හිතන්නේ ඔබතුමාලා දන්නවා. ආසන්නම දේ පෙර පාසල් ගොඩනැගිල්ල විවෘත කිරීම. අපි යම් යම් විදියට හිතුවත් ඒ දේ කෙරුණා. ඒක හොඳයි. හැබැයි එතනදී මම හිතන්නේ ඔබතුමන්ලා මධ්‍යස්ථ වුනේ නෑ. මොකද මේ දැනට ඉන්න හැම දේශපාලඥයෙක්ගෙන්ම ප්‍රයෝජනය ගන්න ඕන. ආණ්ඩු බලය දැන් තියෙන්නේ එක්සත් ජාතික පක්ෂයට. ජනාධිපතිතුමා ඉන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. ඔබතුමාලා යූ. ජී. ඩී. ආරියතිලක මැතිතුමාට ආරාධනා කරේ නෑ. ප්‍රදේශයේ මන්ත්‍රීවරයා, විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීවරයට ආරාධනා කරේ නෑ. ප්‍රශ්න තියෙන්න පුළුවන්. දැන් ඒක නිසා පක්ෂය විදියට අපිට එතනට එන්න අමාරුයි. ජනතා විමුක්ති පෙරමුණ අවසානයේ මෙතනට ගෙන්න ගන්න ඕන නිසා තමයි මෙතන ලස්සනක් නෑ කියන එක උඩ තමයි ආරාධනා කරේ. ඒ ආරාධනාව හරි විදියට පිළිගන්නේ නැතිව වෙන්න ඇති. අපි ඒ කාරණා දිගට කතා කරන්න ඕන නෑ. ඒක නිවැරදි කරගන්න.

ඊළඟට සභාපතිතුමනි, මම විශ්වාස කරනවා මේ වගේ වෙලාවක අපේ පළාත් පාලන ඇමතිතුමා තමයි වජිර අබේවර්ධන මැතිතුමා. එතුමා බලාගෙන ඉන්නවා ගාල්ල දිස්ත්‍රික්කයට මේ හැන්දෙන් වැඩිපුර බෙදන්න. ඉතින් ඒවෙලේ එතුමට වුනත් ආරාධනා කරානම් ඉතාම නිවැරදියි ඒක.

ඊළඟට මම ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි, වෙන මොකක්වත් නෙමෙයි අපේ දිස්ත්‍රික්කයේ අපේ නායකයා ඒක පැත්තකට දාන්න. පළාත් පාලන ඇමතිවරයා විදියට එතුමගේ පින්තූරයක්වත් මේ සභාවේ ප්‍රදර්ශනය කරන්න කියලා. ප්‍රියජනක පින්තූරයක්නේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි එතුමා එක්ක සාකච්ඡා කරලා බලලා අපිටත් බෙදන හැන්ද අනුව මොකක් හරි බලමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බෙදන හැන්ද අනුව බෑ. ඒකනේ නරක.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කිවුවනේ බෙදන හැන්දක් ගැන. එතකොට බලමුකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බෙදන හැන්ද අනුව බලන්න ගියොත් නම් බේදී බේදී ඉන්න වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ඔබතුමා දන්නවද දන්නේ නෑ අපේ පළාත් පාලන ඇමතිවරයා වන්නේ දකුණු පළාත් සභාවේ මහ ඇමති ෂාන් විජයලාල් ද සිල්වා මැතිතුමා ඔබතුමා දන්නවද දන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම දන්නේ නැත්තේ මොකද?.

(ගරු මන්ත්‍රිනී ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගීවීම සිදුවිය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාට කියපු එක තේරුනේ නෑ. අපේ පළාත් පාලන ඇමතිවරයාට ආරාධනා කරලා එතුමගේ ප්‍රධානත්වයෙන් තමයි ඒ උත්සවය තිබ්බේ. හරිද?.

අපි එතුමගේ ප්‍රධානත්වයෙන් තිබ්බේ. රමේෂ් පතිරණ මන්ත්‍රීතුමන්ගේ ප්‍රධානත්වයෙන් නෙමෙයි. දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා තමයි අපේ පළාත් පාලන අමාත්‍යවරයා වන්නේ. අපි පාලනය වන්නේ දකුණු පළාත් සභාව යටතේ. එතුමගේ ප්‍රධානත්වයෙන් තිබුනේ. ඔබතුමාලගේ අමාත්‍යවරයා පත්වුනා විතරයි. අපිට කැඳවීම මත, අපිත් එක්ක තියෙන සම්බන්ධකම් මත තමයි ඒක ක්‍රියාත්මක වෙන්නේ. මම පාලනය කරන මේ ප්‍රාදේශීය සභාවේ මම බෝඩ් ගහන්නෙ මට ඕන විදියට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා කියන තර්කයත් එක තැනකදී නිකම්ම කැඩෙනවා. ඔබතුමා ඉතා නිවැරදියි. පළාතේ ප්‍රධානියා විදියට එතුමව කැඳවපු එක ඉතා නිවැරදියි.

දැන් ඔබතුමා රමේෂ් පතිරණ මන්ත්‍රීතුමාට ආරාධනා කරා. වැරැද්දක් නෑ. කිසි ප්‍රශ්නයකුත් නෑ. එතුමගේ දේශපාලන හයිය ගන්න නිවැරදි දේට. හැබැයි ඇයි විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමාට ආරාධනා කරේ නැත්තේ?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇයි ඔබතුමාලා කිසිදේකට සහයෝගය නොදුන්නේ. අයවැයට සහයෝගය දුන්නේ නෑ. ඔබතුමාලා කමිටුවලට සහයෝගය දුන්නේ නෑ. මම

බොහොම වගකීමෙන් කියන්නේ. මම ආරාධනා කරනවා මම උදව් කරන අයට. බොහොම වගකීමෙන් මම කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අයවැයට සහයෝගය දුන්නේ නෑ. හෙට දවසෙත් වැදගත් දෙයක් තිබුණත් එන්නේ නෑ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, එතකොට දේශපාලනීකරණය වෙලානේ එතන. දේශපාලනීකරණය වෙන්නේ නෑ කිව්වා. හැම පක්ෂයකටම සලකනවා කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට එක්සත් ජාතික පක්ෂය ඇරෙන්න අනිත් පක්ෂ වැඩ කරනවනේ අපිත් එක්ක. ඉදිරියේදී අපි සාකච්ඡා කරලා එක්සත් ජාතික පක්ෂයෙන් අපිට සභාවේ වැඩ කරගෙන යන්න උදවු කරනවා නම්, අපි අනිවාර්යයෙන් හැම කාරණාවටම ආරාධනා කරනවා. එහෙම නැතිව මගේ කකුලෙන් අදිද්දී මේ සභාවේ මන්ත්‍රීවරු එක්ක කරන්න බෑ.

මම මේ කියන්නේ පරණ කතාව. මතු වුන කාරණාව නිසා, පරණ කතාව මේ කියන්නේ. වැරදි විදියට හිතන්න එපා. වර්තමාන කතාව නෙමෙයි මේ පරණ කතාව මම කියන්නේ. එතනදී මම බොහොම වගකීමෙන් කියන්නේ. මම වජිර ඇමතිතුමාගෙන් ඉල්ලුවා මේ සභා ගොඩනැගිල්ල හදන්න උදව් කරන්න කියලා. එතුමා උදව් කරනවා කියලා කිව්වා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි බොහොම පැහැදිලිව ඒ යෝජනාව කරලා තියෙන්නේ එතුමට. සභා ගොඩනැගිල්ලට විතරක් නෙමෙයි ප්‍රතිපාදන දෙන්න කියලා වෙළඳ සංකීර්ණයට පවා. ඒකටත් ගන්න පුළුවන් වෙනම ශීර්ෂයක් යටතේ. අපි යෝජනා කරලා තියෙන්නේ. නමුත් ඔබතුමා මතක තියාගන්න. පොඩි පැය ගානක වෙනසෙන් ඔබතුමා මට සභාවට ගෙනාපු යෝජනා, මම සභාවට ගෙනාව යෝජනාවල තිබුනේ ඒක. ඒක නැති කරා. ඒක දිගට යන්න ඕන නෑ.

මම ඔබතුමාට කියන්නම්, මම මේ සභාවට ගෙනාපු යෝජනා ඔබතුමා භාර ගත්තේ නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** භාර ගන්න බැනේ න්‍යාය පත්‍රය හැදුවට පස්සේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි දන්නවා ඒක. බොහොම හරි. නමුත් එකක් තියේ ඔබතුමා බලන්න. අපි බොහොම කැමතියි චමින්ද මන්ත්‍රීමා, පෝද්දල කනත්ත ඉඩම අත්පත් කරගන්න එක කරන්න. නමුත් එකක් තියෙනවා. මුල් සභාවේ ඉඳලා බොහොම පැහැදිලිව යෝජනා තිබුනා. සිට්ට්‍රස් වත්තේ ඉඩම ගන්න ඕන එක ගැන.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** සභාව සතු වත්කමක් හැටියට පෝද්දල සුසාන භූමිය තියෙනවා. ඒක අත්පත් කරගන්න දෙයක් නෑ. ඒක නීත්‍යානුකූලව මැනලා සභාවට වෙන් කරගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක නෙමෙයි මම කියන්නේ ගියේ මන්ත්‍රීතුමා මේක ආරවුල් ඇති කරගන්න ඕන නෑ. මම කියන්න ගියේ. ඒක එන්න ඉස්සර වෙලා අපි පහුගිය සභාවලත් මේක යෝජනා කරලා ගියේ. මම යෝජනා කරලා තියේ. ඊට පස්සේ යසරත්න මන්ත්‍රීතුමා යෝජනා කරලා තියෙනවා සිට්ට්‍රස් වතුයායෙන් අක්කර 05 ක් ගන්න කියලා. ඒකට විධිමත් වැඩපිළිවෙලක් තියෙනවා කියලා, කියලා ඉවර වුනාට පස්සේ ඒක දාන්නේ අන්තිමට. ඔබතුමා බැරි තැන කියනවා ඔබතුමා ලේකම්තුමා එක්ක එකතු වෙලා ලියුමක් දාන්න කියලා. අදත් නෑ ඒ වැඩේ කෙරුනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතින් එකතු වුනාද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අදටත් විධිමත් ලියුමක් ගිහින් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දෙන්නා එකතු වෙන්නේ නැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ප්‍රශ්නෙයි උත්තරෙයි දෙකම දන්නේ නැනේ. මම කිව්වම තරහ යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ යෝජනාවේ නිවාස ව්‍යාපෘතියකටත් ඉල්ලලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගම් පුළුල් කිරීම යටතේ ගන්නේ. අක්කරයක් ආදාහනාගාරය සඳහා ගත්තත් නොගත්තත් ඒක අපිට පුළුවන් කුණු ප්‍රතිචක්‍රීකරණයට ගන්න. ඒ වගේ වැඩ වලට ගන්න පුළුවන්. ඒකට විධිමත් ලියුමක් ඇරියේ නෑ. හැබැයි ඇරියේ නැත්තේ වෙන මොකක්වත් නෙමෙයි ඒකෙ තියෙනවා. බොහොම පැහැදිලිව මේ සභාවෙත් කතා කරා. ඒක ඉස්සරහ වෙනවා නම් ඒක කරමු. මේක ඉස්සරහ වෙනවා නම් මේක කරමු කතාව කිව්වා. ඒ හින්දා මේක පහුකරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද ලියුම හදලා දෙන්නම්. ඔබතුමාට ඕන විදියකට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපේ ඇමතිවරු බලන් ඉන්නවා ඒක එනකම්. විධිමත් ලියුමක් නැතුව කොහොමද ගන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට දෙන්න පුළුවන් අක්කර 05 ක් ආදාහනාගාරයක් ලබා ගන්න කියලා. නිවාස සඳහා දෙන්න කියන්න බෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ආදාහනාගාරයක් හා ප්‍රතිචක්‍රීකරණ වැඩසටහනකට කියලා දාලා දෙන්න.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාවේ ඉදිරි වැඩ කටයුතු සඳහා කියලා දාන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අද ඒක දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මටත්, චමින්ද මන්ත්‍රීතුමාටත්, අපි කාටත් ඕන. කොතන හරි වැඩේ ආරම්භ කරන්න. කිසි ප්‍රශ්නයක් නෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙතුමා කියන ප්‍රශ්නය පිළිබඳව දිගින් දිගටම සාකච්ඡා කරා. මට කිසිම අවශ්‍යතාවයක් නෑ පෝද්දලම හැදිය යුතුයි කියලා ආදාහනාගාරයක්. මේ වසර හතර තුල බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව සතුවිය යුතුයි ආදාහනාගාරයක්. ඒක ගැන විතරයි මම කතා කරන්නේ. සුසාන භූමියක් වෙන්වෙලා තියෙනවා පෝද්දලට. ඒක යම් යම් පුද්ගලයන් අල්ලගනිපු නිසා තමයි මේ ප්‍රශ්න පැන නැගිලා තියෙන්නේ. ඒක වෙන් කරලා මැනලා තාප්ප ගහලා සුසාන භූමිය ලෙස සංවර්ධනය කරන්න ඕන.

ඊට පස්සේ මෙතුමා කියන මේ අක්කර පහ ලැබෙනවා නම් අපිට කිසි ගැටලුවක් නෑ ආදාහනාගාරය හදන්න පුළුවන්. මෙතුමට අවශ්‍යතාවයක් තියේනම් මෙතුමා උනන්දු වෙලා මේ වැඩේ කල යුතුයි. සහයෝගය දැක්විය යුතුයි. වැඩේ කරන්නේ නෑ කියලා සභාපතිතුමාට ඇඟිල්ල දික් කරනවට වඩා වැදගත් ඒකට සහයෝගය දක්වන එක මන්ත්‍රීතුමනි.

(සභාව ඝෝෂාකාරි විය)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අහන්න ලේකම්තුමාගෙන් මං ඇහුවේ නැද්ද? කියලා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. අපි ගරුකරන මන්ත්‍රීවරයෙක්. ඔබතුමා හැමදේම පෙන්වා දෙන මන්ත්‍රීවරයෙක් විදියට බැඳීමෙන් සහයෝගයෙන් වැඩ කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඔබතුමා හැමවෙලේම ප්‍රශ්න කරලා මේක ඇදගෙන ගිහිල්ලා මේ සභාව අඩපණ කිරීමක් කරනවා කියලා අපිට පේනවා. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලනවා වැඩිහිටි මන්ත්‍රීවරයෙක් විදියට මේ සභාවට සහයෝගය දෙන්න. ඔබතුමා කියන එකට මම එකඟයි. ඔබතුමාලගේ ආණ්ඩුවක් තියෙන්නේ. ඔබතුමාට පුළුවන් පුද්ගලිකව හරි කතා කරලා මේක කරලා දෙන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාලා බලන්න අද නෙමෙයි මේ යෝජනාව ගෙනාවේ. පහුගිය ආණ්ඩු කාලෙත් කරා. ඒ යෝජනා කරාට ඒ ඉන්න දේශපාලන අධිකාරිය කරේ නෑ. අපේ වැරදි නෙමෙයි. දේශපාලන අධිකාරියේ වැරදි තියෙන්නේ. සංවර්ධන කමිටුවේ කී පාරක් කතා කරාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද ලියුම හදලා දෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අද දෙනවානම් කිසි ප්‍රශ්නයක් නෑ. අර ආදාහනාගාරය එතන හදන්න පුළුවන්නම් එතන හදන්න. මෙතන හදන්න පුළුවන් නම් මෙතන හදන්න. හැබැයි මේක ගන්න වැඩ පිළිවෙල කරන්න.

ඊළඟට මම ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි, යෝජනාවක් ගෙනාවහම කරන සම්ප්‍රදායක් හා කරන නිවැරදි ක්‍රමයක් තියෙනවා. යෝජනාවක් ගෙනල්ලා ඒක ක්‍රියාත්මක කරන්න දැම්මම ඒ අදාල යෝජනාව කරපු අයට දන්වන්න. මේක කරා කියලා. නැත්නම් මේකේ අනිත් පැත්තත් මම කියන්නම්. මේ සභාවේ එහෙම වෙලා තියෙනවා. එහෙම කිවුවහම ඔබතුමාලා හිතන්න එපා දැන් තියෙන සභාව කියලා. යෝජනාවක් කරහම ක්‍රියාත්මක කරා කියලා දන්වනවා. ක්‍රියාත්මක වෙලා කියලා දැන්නුවට ක්‍රියාත්මක වෙලා නෑ. අපි දන්නවා එහෙම වෙච්ච දේවල්. අපි ළඟ ඒ ලියුම තියෙනවා නම් මාත්

දන්නවා, ගරු සභාපතිතුමත් දන්නවා. ඒ නිසයි කියන්නේ අදාළ මන්ත්‍රීවරයාටත් ඒක දැනුම් දෙන්න කියලා. එතකොට අපිට බලන්න පුළුවන් ක්‍රියාත්මක වෙලාද? නැද්ද කියලා. සභාපතිතුමනි, එහෙනම් ඒ විදියට කරන්න.

අපේ ගරු ඇමතිතුමාව මන්ත්‍රීවරු හත්දෙනාම ගිහින් හම්බවුනා පහුගිය කාලයේදී. හම්බවෙලා බොහොම පැහැදිලිව එක තැනක ඉඳගෙන කතා කලා. එතුමා බලාගෙන ඉන්නවා මේ සභාවට විතරක් නෙමෙයි දකුණු පළාතේ සභාවලට, විශේෂයෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ සභාවලට ඇති තරම් වැඩ කරන්න. අපි මහන්සිවෙලා අපේ වැඩ ටික කරගන්න ඕන. වෙළඳ සංකීර්ණයක් පවා අපි යෝජනා කරා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මෙතුමා කරපු යෝජනාව අනුව සභාවට ඔබතුමා ප්‍රකාශ කර සිටියා මුලින් එන එක තමයි ක්‍රියාවට නගන්නේ කියලා. ඔබතුමාට ටිකක් මතක් කරන්න ඕනේ අබේසේකර මන්ත්‍රීතුමා කිවුවා වගේ පෙර පාසල විවෘත කරන උත්සවයට අපේ පක්ෂයේ සංවිධායකතුමාට ආරාධනා කරලා තිබුනේ නෑ. අනිත් පක්ෂවල සංවිධායකවරුන්ට ආරාධනා කරලා තිබුණ නිසා අපිට සහභාගි වෙන්න බැරි වුනා. එතකොට ඔබතුමා කිවුවා උදවු කරන විදිය අනුව කියලා. පහුගිය දවස්වල අපේ එක්සත් ජාතික පක්ෂයේ උත්සවයක් තිබුණහම ඔබතුමාට ආරාධනා කරලා ඇති. ඇමතිතුමා ලගට ගෙන්න ගෙන ඔබතුමාව වාඩි කරගෙන තියෙනවා. නිල පියස, ඉස්කෝලවල උත්සව හැම එකටම ඔබතුමාට ආරාධනා කරනවා. අපි එහෙම කුහක නෑ. අපි කියන්නේ නෑ සභාපතිතුමාව ගන්න එපා කියලා. අපේ බලප්‍රදේශයේ සභාපති ඔබතුමා නිසා ඔබතුමාට දෙන්න ඕන ගරුත්වය දෙන්න ඕන. ඔබතුමාට ආරාධනා කරා කියලා සංවිධායකතුමා මුකුත් කියන්නේ නෑ. ඔබතුමත් දැනගන්න ඕනේ අදාළ ප්‍රදේශයේ සංවිධායකවරු ගෙන්න ගන්න. හේතුව පහුගිය දවස්වල උත්සවයක් තිබුණා කරන්දෙණිය ප්‍රදේශයේ පළාත් පාලන ඇමතිතුමත් ඇවිල්ලා. ඒ වේලාවෙදි ඔය යෝජනාව ආවා. සභාපතිතුමා විපක්ෂයේ කණ්ඩායමත් එක්ක කතා කරලා ඒ යෝජනාව කරන්න කියලා ඇමතිතුමා පත්වීම් ලබපු දවසේ අපිට මුලින්ම කිවුවා. මේක හදන්න අපිටත් ඕන. අපේ සභා බලප්‍රදේශය. අපිටත් තිබුණා මේක හදන්න ඕන නෑ අපි ආපු දවසක මේක හදමු කියලා ඉන්න. අපි එහෙම කරේ නෑ. මේ බලප්‍රදේශයේ ජනතාවට සේවයක් වෙන්න ඕන නිසා. පරණම ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල මේක. ඒක නිසා මේක හැදෙන්න ඕන. මම ඇමතිතුමාට ප්‍රකාශ කර සිටියා ගාල්ල දිස්ත්‍රික්කයේ තියෙන පරණම සභා ගොඩනැගිල්ල මේක කියලා. අපි කිවුවා ඇමතිතුමා මේකට වැඩි වෙලාවක් ගන්න ඕන නෑ. සැලසුම් ඇඳලා ඇස්තමේන්තු සකස් කරලා තියෙන්නේ. ඔබතුමාට තියෙන්නේ මුදල් වෙන් කරන්න විතරයි කියලා. මුල්ගල තියලා පටන් ගන්න. මේක හැකි ඉක්මනින් වැඩ ටික කරන්න කටයුතු කරන්න. පළාත් පාලන ඇමතිතුමා වශයෙන් ලේකම්තුමා ඉස්සරහ තියාගෙන කිව්වේ එතුමට ලැබෙන අමාත්‍යාංශයෙන් වැඩිපුරම බෙදන්නේ ගාල්ල දිස්ත්‍රික්කයට කියලා. එතුමා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව ගාල්ලට ගේන්න හදන්නේ. එතුමා ඒ වැඩ කටයුතු ටික කරනවා. එතකොට සභාපතිතුමා දැනගන්න ඕනේ සංවිධායකවරු ගෙන්න ගන්න. ගෙන්නුවා කියලා ඔබතුමාට අඩුවක් වෙන්නේ නෑ. විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා ගෙන්නුවා කියලා දේශපාලනය කතා කරනවාද?. දේශපාලනය කතා කරන්නේ නෑ. ඔබතුමා වර්ණනා කරයි. මෙතුමා සභාපතිවෙලා මේ වැඩේ කරා කියලා. ඒ නිසා ඔබතුමා කුහකකමක් නැතුව මින් ඉදිරියට ආරාධනා කරන්න. නැත්නම් අපේ මිනිස්සු අපිට කියනවා මෙයා මෙහෙමයි කියලා. ඒක නිසා එහෙම නොවෙන්න ඔබතුමා සහයෝගයෙන් අපේ සංවිධායකතුමා එක්ක වැඩ කරගෙන ගියොත් අපි ඒකට උපරිම සහයෝගය දෙනවා. මේ සභාවේ වැඩවලට අපි බාධාකරනවා නෙමෙයි. අපි සභාපතිතුමාට උදවු කරනවා. සභාවේ වැඩ වලට උදවු කරනවා. අයවැය ලේඛණයට විරුද්ධ උනයි කියලා නෑ. ඕනම සභාවක විපක්ෂය අයවැයට විරුද්ධ වෙනවා. 2002 ඉඳන් ඉඳපු මන්ත්‍රීවරයෙක් වශයෙන් ඒක මහලොකු ප්‍රශ්නයක් කරගන්න එපා. ගිය සභාවෙත් අපි කිවුවේ කමිටුවලට එනවා. ඔබතුමා කිවුවා කමිටුවලට අපි ආවේ නෑ කියලා. මම ඒක ගිය සභාවෙත් පැහැදිලි කරා. අපිට කමිටුවලට එන්න බැරිවුනේ අන්තිම මාස දෙක. ඒක එහෙම වුනේ ආණ්ඩුවේ ප්‍රශ්නය නිසා. ඒක නිසා ඔබතුමා කතාකරන කොට වැරදි කෝණයෙන් උපකල්පන කෝණයෙන් බලන්න එපා. ඔබතුමාට වෙලා තියෙන්නේ ඒක තමයි. මෙයාලා යන්නේ අනිත් පැත්තටමයි කියලා හිතාගෙන වැඩකරන්නේ නැතුව සුබදායිව හිතලා වැඩ කරන්න. ඔබතුමා ඉදිරියට සහයෝගයෙන් වැඩ කරන්න. එතකොට අපිත් සහයෝගය දෙන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විනාඩියක් දෙන්න සභාපතිතුමා, කපුහෙම්පල ප්‍රශ්නය ගැන කතා කරන්න. ඒක කතාකරපු නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** උඩුල මන්ත්‍රීතුමා තුන්පාරක් නැගිට්ටා. උඩුල මන්ත්‍රීතුමා කතා කරන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, පළමුව මම අපේ චමින්ද මන්ත්‍රීතුමාට සුබ පතනවා. මන්ත්‍රීවරු විසිදෙදෙනාම එක මතයක සිටීම ගැන. බෝපෙ පෝද්දලට දැඩි අවශ්‍යතාවයක් තමයි ආදාහනාගාරය. ඇත්තටම ඒක එතුමා කියන්න වගේ එතුමගේ ගමේ නෙමෙයි කොතනක හෝ මේ ප්‍රදේශයේ ඇතුළත ආදාහනාගාරය ඉදිවෙනවා නම් බෝපෙ පෝද්දල ජනතාවට ලොකු සහනයක්. බෝපෙ පෝද්දල ජනතාව පිට ආදාහනාගාර තමයි භාවිතා කරන්නේ. දඩල්ල,

කුරුඳුවත්ත, බද්දේගම වගේ. එතකොට බෝපෙ පෝද්දලින් පිට තමයි මරණයක් සිදු වුනහම ඒ කටයුතු සිදු කරන්න වෙලා තියෙන්නේ. ඇත්තටම බෝපෙ පෝද්දලට තිබුණොත් වෙන තැනකට ගෙවන්න යන මුදලින් රුපියල් දෙදහස් පන්සියයක් විතර ඉතුරුයි. ඒ මුදල යන්නේ නෑ ප්‍රාදේශීය සභාව ඇතුළත එකක් තියෙනවානම්. ඒක කඩිනම් අවශ්‍යතාවයක් සේ සලකා ක්‍රියාකරන්න කියලා මම පළමුවෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

දෙවනුව අපේ ප්‍රේමලාල් අබේසේකර මන්ත්‍රීතුමා, කියාස් මන්ත්‍රිතුමා දිගින් දිගටම මතක් කරා වගේ ඇත්තටම අපි උත්සවයක් කරද්දි මේ සභාවේ මන්ත්‍රිවරු 22 ක් ඉන්නවා. එක එක පක්ෂ ඉන්නවා. විවිධ මතිමතාන්තර ඇති. නමුත් අපි උත්සවයකදී පොදුවේ හැම පක්ෂයක්ම නියෝජනය වන පරිදි ආරාධනා කරන්න. ඒ නායකයෝ උත්සවයෙන් පස්සේ යම් කිසි මුදලක් පරිත්‍යාග කරන්නත් පුළුවන්. මේක නිසා සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිවරුන් වශයෙන් ගරු දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍ය යූ. ජී. ඩී. ආරියතිලක මැතිතුමා, එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රි විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමත් සම්බන්ධ කර ගන්න තිබුණා. වජිර අබේවර්ධන ඇමතිතුමත් සම්බන්ධ කර ගන්න තිබුණා. රත්න ගමගේ මැතිතුමාට ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් ආරාධනා කරන්න තිබුණා. ඒ ආරාධනා පත්‍රයට ඒ අයගේ නම් ඇතුලත් වුනානම් හොඳයි කියලා හිතෙනවා.

පහුගිය දවස්වල දිගින් දිගටම මතක් කරා ගරු සභාපතිතුමා මුද්දර ගාස්තු එවුවේ නෑ කියලා. දකුණු පළාත් මහ ඇමතිතුමා පළාත් පාලන විෂයභාර ඇමතිතුමා වශයෙන් පහුගිය දවස්වල ලක්ෂ 50 ක් ලබා දීලා තියෙනවා. මම ඒ මුදල හරියටම කියන්න දන්නේ නෑ. ඔබතුමා ඒක ගැන පැහැදිලි කිරීමක් කරන්න. දිගින් දිගටම ආණ්ඩු පක්ෂය අපිට සල්ලි ලැබුනේ නෑ කියලා තමයි කිව්වේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා ඔබතුමා දන්නේ නැති නිසා මම පැහැදිලි කරන්නම්. මුද්දර සල්ලි කියන්නේ කාගෙවත් මුදල් නෙමෙයි. අපේ බලප්‍රදේශයේ ඉඩම් විකුණනකොට, ඔප්පු ලියනකොට ගන්න මුද්දර ගාස්තු. ඒවා අපිට අයිති මුදල්. අපේ ප්‍රාදේශීය සභාවට අයිති මුදල් කෝටි දෙකහමාරක් විතර එන්න තිබුණා මම සභාවේ සභාපතිවරයා වෙනකොට අපිට ලැබිය යුතු මුද්දර ගාස්තු. දැන් වෙලා තියෙන ඒක කාගෙද බූදලේ වගේ. අපිට හිඟා කාලා ගන්න වෙලා තියෙන්නේ ඒ මුදල්. ඒ මුදල් වලින් එක පාරක් ලක්ෂ 40 ක් දුන්නා. තව පාරක් ලක්ෂ 50 ක් දුන්නා. තව අපිට එන්න තියෙනවා සල්ලි. පළාත් සභාව විසුරුවන්න තියෙන්නේ තව බොහොම සුළු කාලයක්. මාස 2 ක් 3 ක් වගේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඇත්තටම ඒක ලැබිය යුතු මුදලක් තමයි. ඔබතුමා දිගින් දිගට චෝදනා කරා ඒක ලැබුණේ නෑ කියලා. ඒ වගේ කොටසක් හරි ලැබීම පිළිබඳව සන්තෝෂ වෙන්න ඕන. ඉදිරියේදී ඒ සියලු මුදල් ලැබේවි.

ඒ වගේම මතක් කරන්න ඕන. අපේ කොට්ඨාශයට තාම ලයිට් එකක්වත් දාගන්න බැරි වුනා. ඔබතුමා කීවේ ගයාන් මන්ත්‍රීතුමා විරුද්ධ වුනා කියලා. එතුමා කියනවා ඇහුනා 22 ටම දෙන්න කියලා. බොහොම සන්තෝසයි ඒ අදහසට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කතාව වැරදියි. ලියනගේ මන්ත්‍රීතුමා විරුද්ධයි කියලා නෙමෙයි කිවවේ. අපේ පක්ෂයේ මන්ත්‍රීවරු තීන්දුවක් අරගෙන තියෙනවා. ඒක ගිය සැරෙත් කරා. විපක්ෂයට දෙන්නේ නෑ කියලා පොදු තීන්දුවක් අරන් තියෙනවා. ඒක ලියනගේ මන්ත්‍රීතුමාවත් වෙන කිසිකෙනෙක් කියන්න ඕන කාරණාවක් නෙමෙයි. ඒක පොදු තීන්දුවක්. අබේසේකර මන්ත්‍රීතුමා ඉදපු ගිය සභාවල එතුමා යෝජනා කරේ. කලින් පාරවල්වල අපි එකට ඉන්න කොට ඒ මතේ හිටියා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම පෞද්ගලිකව එහෙම දෙන්න එපා කියලා නෑ. හැබැයි විපක්ෂයට ඉතිහාසය පුරාවට මේකේ බෙදලත් නෑ. බෙදනවනම් මේ 22 ටම එකට බෙදන්න ඕන කියන මතයේ ඉන්නවා. හැබැයි තනිව නම් දෙන්න එපා විපක්ෂයේ කාටවත්. මම ඒකට විරුද්ධයි.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම හිතනවා කවුරුත් මේ ප්‍රශ්නයට එකඟයි. කවුරුවත් විරුද්ධ නෑ. කපුහෙම්පල ප්‍රශ්නය ඔබතුමා කිවුවා. කපුහෙම්පල ප්‍රශ්නය දැන් ඇවිල්ලා තියෙන තැන තමයි අවසානයේදී මුදල්වලට සියල්ල යටවෙලා තියෙනවා ගරු සභාපතිතුමනි. පොලිසියේ ඉදලා, S.T.F. එකේ ඉදලා හැම කෙනාම යටවෙලා තියෙනවා. මම බය නැතුව කියන්නේ මොකද පහුගිය දවස්වල ඔය සියලු දෙනාම එක ළඟ ඉදගෙන කතා කරා. කතා කරාම කපලා කොටලා ඉවර වෙනකන් මුකුත් නෑ. වැඩේ තියෙන්නේ. මෙතනදී ඔබතුමා කියලා රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා කතාකරා අපිත් ඉන්නකොටම. තාක්ෂණ නිලධාරි දිනූෂ මහත්තයා යැව්වහම පොලිසියේ කියලා මොනව හරි හොයා ගන්න. සභාවෙන් අලුත් ලියුමක් ඕන කියලා. ඉතිං දැන් ප්‍රශ්නය තියෙන්නේ

සභාපතිතුමනි, මෙතන නෙමෙයි. මේක ගැන කියන්න ඕන මේ ගරු සභාවේදී ඇත්තටම මම ඔබතුමාට පෞද්ගලිකවම කතා කරලා කිව්වා එන්න පුළුවන්නම් මෙහෙමයි කියලා ප්‍රශ්නේ. ඔබතුමා කිවුවා කණ්ඩායම් රැස්වීමක් තියෙයි කියලා. මම ප්‍රියන්ත මන්ත්‍රීතුමාට කිවුවා අනිත් අයටත් කියන්න කියලා. අපේ මන්ත්‍රීවරු සියලු දෙනාටත් කිවුවා. හැබැයි අද කපුහෙම්පල ජනතාව ඉන්නේ කොතනද දන්නවාද?. මේ ප්‍රශ්නයට සහයෝගය නොදෙන කිසිම දේශපාලඥයෙකුටම ගමට එන්න දෙන්නේ නෑ කියන මට්ටමේ. ඒ හේතුව බොහොම සාධාරණයි. පොදු වස්තුවක් මංකොල්ලා කන්නේ. ගරු සේනපාල අමරසේකර මන්ත්‍රීතුමා අත්පත්කරගෙන, ආචාර්ය රිච්ඩ් පතිරණ මැතිතුමා ඒක රැකගෙන තියාගෙන ආපු එක ගිහිල්ලා තියෙනවා කූඨ ලේඛණ හදලා. ඉතිං දැන් තියෙන ප්‍රශ්නය තියෙන්නේ එතන නෙමෙයි. අද මගේ පක්ෂය ගැන මට දුකයි. මම පක්ෂය ගැන බොහොම කණගාටු වෙනවා. අහිංසක මන්ත්‍රීවරුන්ට මම මුකුත් කියන්නේ නෑ. ඇත්තටම මම මෙතනදි කියන්න ඕන පක්ෂයක් විදියට හරියට මැදිහත් වුනේ ජනතා විමුක්ති පෙරමුණ විතරයි. එතුමන්ලා විතරයි මේකට මුල ඉදන් ඇවිත් පක්ෂයක් විදියට මැදිහත් වුනේ. අබේසේකර පුද්ගලයෙක් විදියට යනවා. පක්ෂයක් විදියට අපි යන්න ඕන මෙතනට. මම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලනවා තමුන්ගේ නායකයන්ට බලපෑම් කරලා හරි ඉල්ලන්න කියලා මේ ප්‍රශ්නෙට මැදිහත් වෙන්න. මම ඉල්ලනවා ගරු සභාපතිතුමනි, ලියුමක් හදලා යවන්න රමේෂ් පතිරණ මන්ත්‍රීතුමාට මේකට පාර්ලිමේන්තුවේ හඬක් නගන්න කියලා. අපේ විරුද්ධ පක්ෂයේ නායකතුමාට මම යෝජනා කරනවා මේක යෝජනාකරලා යවන්න කියලා විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමාට පාර්ලිමේන්තුවේ හඬක් නගන්න කියලා. මම හිතනවා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවේ හඬක් නගයි කියලා. නමුත් අපි ලැජ්ජ වෙන්න ඕනේ අපේ මන්ත්‍රීවරු එක්කෙනෙක්වත් ආවේ නෑ. මම දන්නේ නෑ ඇයි හේතුව කියලා. ඇයි මෙහෙම නේන්නේ. මම කියාස් මන්ත්‍රීතුමාට, යසරත්න මන්ත්‍රීතුමාට, රංගනී මන්ත්‍රීතුමියට කතා කරලා කිව්වා අපේ විජේපාල මන්ත්‍රීතුමාව දැනුවත් කරලා මෙතනට එන්න කියලා. ඒක පොදු වස්තුවක් හින්දා රැකගන්න ඕන. නමුත් කවුරුවත් ආවේ නෑ. රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා අවසානේට ආවේ. කණ්ඩායම් රැස්වීමක් තිබුණා කියලා. එතුමා අවශ්‍ය වැඩ කොටසක් කරා.

ගරු සභාපතිතුමනි, සභාවක් විදියට ගිහිල්ලා අද බලමු. පොලිසියේ ඉඳලා සියලුම නිලධාරින් අල්ලලා තියෙනවා. මම කණගාටුවෙනවා. මේ මාධ්‍යවේදීන් අපිට හැමදාම සහයෝගය දෙනවා. අපි මාධ්‍යයට හැමදාම ගරු කරනවා. හැබැයි පත්තරේක ඇරෙන්න ඒක ගියේ නෑ. ඒ ගොල්ලන් ඇවිල්ලා කැමර් ටික ඇල්ලුවට ගියේ නෑ. ලොක්කෝ හිතුවේ නෑ පත්තරවල යයි කියලා. නමුත් එකක් තියෙන්නේ මම විශ්වාස කරනවා මෙතුමලා කරන්න පුළුවන් උපරිම විදියට ඒ වාර්තා ටික ඇරියා තමන්ගේ ආයතනවලට. හැබැයි එක ආයතනයකවත් මෙච්චර වැදගත් දෙයක් දැම්මේ නෑ. ඉස්කෝලේ ළමයිගේ ඉදලා එළියට බැහැලා දෙමව්පියොත් ඇවිල්ලා ඒ කරපු සටන ඒ එක දෙයක්වත් ප්‍රවෘත්තියක් වුනේ නෑ. ප්‍රවෘත්තියක් නොවුයේ වෙන දෙයක් හින්දා නෙමෙයි මුදල් එක්ක. මෙතුමන්ලා නෙමෙයි ඉහළ අය. මෙතුමන්ලා එතනට ගියාම අන්තිම කුණු විදියට බනින්නේ තමුසෙලා මොකටද ආවේ කියලා. බැනුම් අහගෙන ගිහිල්ලා දාපු වාර්තාවල් ඒ ආයතනවල ගියේ නෑ. මම යෝජනා කරනවා ඉස්සරහ කාලේදී අපි මේ මාධ්‍යයට යන්න. අර කාන්තා පක්ෂය ගියා මාධ්‍යායතන වලට. මම දන්නේ නෑ අපේ පක්ෂය ඇයි ඒවා විවේචනය කරේ කියලා. මට තේරුම් ගන්න බෑ ඒ ඇයි කියලා. මාධ්‍ය ආයතන මධ්‍යස්ථ වෙලා හැසිරෙන්න ඕන විදියක් තියෙනවා. මම යෝජනා කරනවා මේ සභාවට අපි සියලු දෙනා ගරු සභාපතිතුමනි එක්කහුවෙලා ගිහිල්ලා මාධ්‍ය ආයතන දැනුවත් කරන්න ඕනේ විනාඩි 05 ක් හරි ඉස්සරහින් ඉඳගෙන. මේ වගේ වැදගත් ප්‍රශ්නයක් එනකොට ඇයි මාධ්‍යය ඒ තැන්වලට යවන්නේ නැත්තේ කියලා. මෙතුමන්ලගේ වරදක් නෙමෙයි. මෙතුමන්ලට මම හැමදාම ගරු කරනවා. මොන වැඩේ තිබුණත් මේ වැඩේ කරන නිසා ඇවිත්. මේ ගැන සියලු මන්ත්‍රීවරු අවධානය යොමු කරලා යමු කියලා මම කියනවා. පොලිසිය ඒකට ක්‍රියාමාර්ගයක් ගන්නේ නැත්නම් අපි ගිහින් පොලිසිය ඉස්සරහ රැදී ඉන්න යෝජනා කරනවා තමුන්නාන්සේලාට අවසාන වශයෙන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, අබේසේකර මන්ත්‍රීතුමා කියපු දේ ගැන පොඩ්ඩක් කතා කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමාලා ඒක කණ්ඩායම තුළ බේරගන්න. සභාවේ න්‍යාය පත්‍රයට වැඩ කරන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** සභාවට අදාළ එකක් මම කතා කරන්නේ. එතනදී අපේ විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමත් විරුද්ධයි ඒ ඉස්කෝලේ ප්‍රශ්නෙට. ඒකේදි වුනේ සභාපතිතුමනි අපේ විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කෙලින්ම කතා කරා ප්‍රාදේශීය ලේකම්තුමාට. ප්‍රාදේශීය ලේකම්තුමා පැහැදිලි කරලා කිවුවා. ප්‍රාදේශීය ලේකම්තුමාට උසාවියෙන් කියලා තියෙලු මේකට මොකක් හරි වුනොත් වන්දි ගෙවන්න වෙයි කියලා. ඒ අනුව ඒකට එතුමා නිහඬව ඉදලා තියෙනවා. ඊට පස්සේ ඉහළ උසාවියේ නඩු දාන්න කිවුවලු. ඒ ඉහළ උසාවියේ නඩු දානකන්, ගාල්ලෙන් භාර අරගෙන නෑ නඩුව. ඉහළ උසාවියේ නඩු දාලා තිබුණලු ඒ වෙනකොටත්. අදාළ පාර්ශව උසාවියට ගිහින් කිවුවම කිවුවලු ප්‍රාදේශීය ලේකම්තුමා මේක නිරාකරණය කරන්නේ නැත්නම් වන්දි ගෙවන්න වෙයි කියලා. ප්‍රාදේශීය ලේකම්තුමා ඊට පස්සේ දන්වලා තියෙන්නේ.

මේකට අපි විරුද්ධයි. අපි ඉඩම ලබා දීම පිළිබඳ විරුද්ධයි. අපේ පක්ෂයත් විරුද්ධයි. මේක ආරම්භ කරේ කවුද කියලා හොයන්න ඕන. ආරම්භ කරේ කවුද?. සභාවේ හිටියේ කවුද?. කවුද හිටිය සංවිධායකවරු. දුන්නේ කවුද කියලත් හොයන්න ඕන. දීලා ඉවරවෙලා ඒ ගොල්ලෝ ඔක්කොම කරගෙන යූ. එන්. පී. එකට එන්න කියනවා. ජනක බණ්ඩාර තෙන්නකෝන් ඉඩම් ඇමති කාලේ ඒක දුන්නේ. එතකොට රමේෂ් පතිරණ මන්ත්‍රීතුමාලගේ ආණ්ඩුව තිබුණේ. ඔක්කොම දීලා සයිටම් එක වගේ අපි බැට කනවා. ඒ වගේ තමයි මේකත් වෙලා තියෙන්නේ. අපි විරුද්ධයි මේකට. සිද්ධිය ඒකයි. ඒ නිසා මේකට අපි ඉස්සරහටත් අපේ විරෝධය ප්‍රකාශ කරනවා. අපි අවශ්‍ය තැන්වලදී පක්ෂයක් විදියට වැඩ කරන්නම් මේ සම්බන්ධව.

(සභාව පැහැදිලි නොවිය.)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම මුලින්ම ස්තුති වන්ත වෙනවා අබේසේකර මන්ත්‍රීතුමාට. එතුමා කපුහෙම්පල ඉස්කෝලේ සම්බන්ධව මතුවුන ගැටළුවේදී අපිත් එක්ක හිටියා. මේ ප්‍රශ්නය ඇත්තටම වුනේ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුකාලේ නෙමෙයි. එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩු කාලේ වෙච්ච සිද්ධියක් මේ. නමුත් මේ සිද්ධියේදී අපි බලපොරොත්තු වුනා ගමේ දෙයක් නිසා, මේ පාසල වැසුනොත් ළමයින්ට යන්න වෙන පාසලක් නෑ. සිරිධම්ම විද්‍යාලයට භාර ගන්නෙත් නෑ. සාමාන්‍යයෙන් සීමාවක් දාලා තියෙනවා. ඊට පස්සේ යන්න තියෙන්නේ තොටගොඩ අත්ථදස්සි විද්‍යාලයට හෝ හිනිදුම්බර කණිෂ්ඨ විද්‍යාලයට. ගම මැද්දේ තියෙන පාසලක් ඇත්තටම මේක. අක්කර නමයක ඉඩමක් තමයි මේ කොල්ලකාලා තියෙන්නේ. ඉතිං ඒ කොල්ලකෑමත් එක්ක අබේසේකර මන්ත්‍රීතුමා පුද්ගලයෙක් වශයෙන් අපිත් එක්ක හිටියා. සභාපතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා මේ කාර්යයේදී. ඔබතුමා සභාපති විදියට ක්‍රියාමාර්ගයක් ගත්තා. හැබැයි ඒ ක්‍රියාමාර්ගය ඉෂ්ටවෙලා තියෙනවා. හැබැයි නඩුව ඉවර වෙලා නෑ. නඩුව ගාල්ල දිසා අධිකරණයෙන් ඉහළ අධිකරණයට දැම්මට තීන්දුවක් දීලා නෑ. නඩුවේ මේක අහවලාට පවරලයි කියලා නෑ. පෙරේදා රාත්‍රීයේ එළිවෙනකත් ඒ අය මැෂින් දාලා කැපුවා. මම මන්ත්‍රී කණ්ඩායමේ සියලු දෙනාට ආරාධනා කරනවා පක්ෂ භේදයකින් තොරව ඒ ඉඩමට ගිහින් බලන්න. ඒ ඉඩමේ කොච්චර විනාශයක් කරලා තියෙනවාද කියලා. සාමාන්‍ය කෙනෙකුට පස් කියුබ් 01 ක් කපා ගන්න, ගහක් කපා ගන්න දෙන්නේ නෑ. ඒක කරපු වන විනාශය, පරිසර විනාශය බලන්න. ඒ සම්බන්ධයෙන් හිතලා ප්‍රාදේශීය සභාව මේ මොහොතේ ඉඳලා හරි මේ කටයුත්ත සඳහා වැඩි අවධානයක් යොමු කරන්න. සියලුම මන්ත්‍රීවරුන් විරුද්ධ වෙනවානම් අද එතනට බලන්න යමු. මම ආරාධනා කරනවා. විවෘත ආරාධනාවක් සියලුම මන්ත්‍රීවරුන්ට එතනට එන්න කියලා. ඇවිල්ලා බලන්න කපුහෙම්පල ප්‍රදේශයේ සිදුවීම. මේ සිදුවීමේ මුල ඉඳලා අපි හිටියා. අදටත් ඉන්නවා. කොළඹට අරං ගිහින් හරි මේ ප්‍රශ්නය විසඳ ගන්නවා. මේ පාසල අපට අවශ්‍යයයි. ඒක රැක ගැනීමේ වගකීම අපිට තියෙනවා. මම ගරු සභාවට ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධව මැදිහත් වෙන්න. ඔබේ පක්ෂවල නායකයන්ට පාර්ලිමේන්තුව නියෝජනය කරන ඔබේ පක්ෂවල මන්ත්‍රීවරුන්ට කියන්න පාර්ලිමේන්තුවේදී මේ සම්බන්ධව විශේෂ ප්‍රකාශයක් කරලා මේ ඉඩම නැවත පාසලට ලබා දෙන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමා ඔබතුමා නිවැරදියි යම් තැනක. ඇත්තටම මම සභාපති වුනාට පස්සේ තමයි දීලා තිබුණ සංවර්ධන බලපත්‍රය තාවකාලිකව නැවැත්වුවේ. ඊට පස්සේ අධිකරණයට ගියා. එතනදී නැවත ඔබතුමා කියන විදියට මේක ගාල්ලේ බැරි නිසා කොළඹ ඉහළ උසාවියට අරගෙන ගියා. එතනදී අපි අත්හිටවපු සංවර්ධන බලපත්‍රය නැවත කොයිවෙලාවකවත් සක්‍රිය කරලා නෑ. අපි පොලිසියේ පැමිණිල්ලක් දැම්මා. නමුත් වැඩේ තියෙන්නේ පොලිසිය ක්‍රියාත්මක වුනේ නෑ. අපිට කරන්න බෑ පොලිසියේ වැඩේ. අපිට බෑ පොලිස් නිලධාරියෝ වාගේ ඒ කාරණේට මැදිහත් වෙන්න. අපිට ගහ මරා ගන්න යන්න බෑ. මම කාර්මික නිලධාරිතුමාට කිවුවා අපේ බෝඩ්එක ගලවලා තියෙනවා නැවත බෝඩ් එක අද කීයට හරි ගහන්න කියලා. අපි පස්සට ගිහිල්ලා නෑ සභාව විදියට. මොනවා කරලා ආවත් අන්තිමට අපි ගාවට එන්න ඕන.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දු තිලක මැතිතුමා ඃ-** ඔබතුමා ගැන විශ්වාසය තියනවා අපි. ඒක නැවත ෆිනෑන්ස් කරන්න ඉඩ නොදී ඉඳී කියලා. ඒ වෙනකන් හරි සභාවේ අවසරය නැතුව ඉඩම සංවර්ධනය කරන්න දෙන්න බෑ. ඒ බැනරය නැවත ප්‍රදර්ශනය කරන්න කියලා ඉල්ලීම කරනවා මම.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අබේසේකර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කපුහෙම්පල ඉඩම සම්බන්ධ කාරණය පිළිබඳ අදහස් දක්වන්න ඕන. මේක ගැන මට ඊයේ දැනගන්න වුනේ නෑ. දැන ගත්තා නම් මම ඊයේ යනවා විරෝධතාවයට. ඇත්තටම මේ කාරණාව සම්බන්ධව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරු මේකට වගකියන්න ඕන. ඒකට හේතුව අද අපි දැක්කා ඒ ප්‍රදේශයේ ජනතාව මෙතනට උද්ඝෝෂණය කරන්න ආවා. තමන්ට, තමන්ගේ ප්‍රදේශයට හානියක් වෙනවා නම් තමයි එහෙම එන්නේ. අපි ඒක වගකීමෙන් කියන්න ඕනේ. ඒ අපහසුතාවයට පත්වුණ හන්දා තමයි ඒ අය මෙතන ඇවිත් උද්ඝෝෂණය කරේ. අපේ මන්ත්‍රීවරුන්ගෙන් මේකට සම්බන්ධ අයත් ඉන්නවා, නැති අයත් ඉන්නවා. හැබැයි මම කියන්න කැමතියි අපි මේකට සම්බන්ධ නොවෙනවානම් මේ කාරණය තුළ හිතන්න පුළුවන් අපිත් මුදලට

යටවෙලා, වෙනත් දේවල් වලට යටවෙලා කියලා. ඒක නිසා අපි නිර්දෝශී නම් අපි විරෝධය පාලා ඒකට නිසි ක්‍රියාමාර්ග ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් මම සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා. සභාව ඉවරවෙලා මම කොහොමත් යනවා. පුද්ගලිකව ඇවිත් එතන බලන්න එන්න කියලා. ඒ වගේම මට කියන්න ඕන අබේසේකර මන්ත්‍රීතුමා සාක්ෂි දරයි අපි මන්ත්‍රීධූර නැති කාලෙත් ඒ උද්ඝෝෂණ වලට සහභාගි වුනා. ඒ වගේම මම කියනවා. වගකීමෙන් සභාපති විදියට මගේ කාලය තුල ඒ අවශ්‍ය පසුබිම නැත්නම් ඒ අත්හිටවපු බලපත්‍රය නැවත සක්‍රිය කරන්නේ නෑ. ඒක බොහොම වගකීමෙන් කියනවා. ඒ අදාල කාරණා සියල්ල නිසි ආකාරව ඉෂ්ට වුනොත් මට කරන්න දෙයක් නෑ. අන්තිම තැනට ඇවිල්ලා අධිකරණ තීන්දු දීලා ඒ තත්ත්වෙට පත්වෙලා ආවොත් එහෙම ඇරෙන්න මම ඒකට අවසර දෙන්නේ නෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ වගේම තමයි අපේ අබේසේකර මන්ත්‍රීතුමත් , කියාස් මන්ත්‍රීතුමත් කියා සිටියා මේ ප්‍රදේශයේ පළාත් පාලන ඇමතිවරයා විදියට වජිර අබේවර්ධන ඇමතිතුමා අපේ සභාවට උදවු කරන්න බලාපොරොත්තු වෙනවා කියලා. ඒ බලාපොරොත්තුව හොඳයි. ඇමතිවරයෙක් ගාල්ල දිස්ත්‍රික්කයෙන් පත් වුනාම ඒ කාරණය පක්ෂ පාට බලන්න නැතිව කරන්න ඕන. ඒක යුතුකමක්. ඒ දේවල් කරාම තමන්ට තමයි ඒකේ ගෞරවය එන්නේ. මට හොඳට මතකයි ආචාර්ය රිචඩ් පතිරණ මැතිතුමා අධ්‍යාපන ඇමති වෙලා ඉන්න කාලේ, රාජ්‍ය පරිපාලන ඇමතිවෙලා ඉන්න කාලේ, උසස් අධ්‍යාපන ඇමතිවෙලා ඉන්න කාලේ ප්‍රදේශයේ ජනතාවට විශාල වැඩ කොටසක් කරා. ඒ නම තාම රැඳී පවතිනවා. ඉතින් මම කියන්නේ මම ගාල්ල ආසනයේ කොටසක ඉන්නේ. වජිර අබේවර්ධන ඇමතිතුමාගේ ආසනේ. මමත් කියනවා වැලිපිටිමෝදර කොට්ඨාශයට වැඩ ටිකක් කරන්න කියලා. මොකද හේතුව තමන්ගේ ප්‍රදේශයනේ. ඒකට පක්ෂ පාට බලන්න ඕන නෑ. තමන්ට වෙලාව ආවම ප්‍රදේශයට වැඩ කරාම ඒක කියයි. දැන් මේ පුස්තකාල ගොඩනැගිල්ල හැදුවේ ආචාර්ය රිචඩ් පතිරණ මැතිතුමා. ඒක කියනවා. ගාල්ල පුස්තකාල ගොඩනැගිල්ල හැදුවේ රිචඩ් පතිරණ මැතිතුමා. ඒක කියනවා. ගාල්ල සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය හැදුවා ඒක කියනවා. ඒ නිසා යම් ඇමතිවරයෙක්, මන්ත්‍රිවරයෙක් දෙයක් කරා නම් ඒක පවතිනවා. ඒ කාරණය හිතට අරගමු මම පොදුවේ ඉල්ලා සිටිනවා.

කියාස් මන්ත්‍රීතුමා කිවුවා වගේ මාස 02 ක් ආණ්ඩුව තිබුනේ නැති නිසා අපිටත් කියන්න වෙන්නේ අපිත් උසාවි ගියා ඒ නිසා අපිටත් සහභාගී වෙන්න වුනේ නෑ කියලා. ඒක නෙමෙයි මතය. අපි කවුරුත් එකතු වෙලා මෙහෙ වැඩ ටික කරමු. බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වගේම මට අමතක වුන කාරණාවක් තියෙනවා. අපි කොයි වෙලාවකවත් මන්ත්‍රීවරු අවතක්සේරු කරන්නේ නෑ. මන්ත්‍රීවරුන්ගේ ගෞරවය කොයිවෙලෙත් ආරක්ෂා කරනවා. මේ ගොඩනැගිල්ල බලන්න. මේ ගොඩනැගිල්ලේ තියෙන්නේ සභාපතිතුමාගේ නම විතරයි. මන්ත්‍රීවරු හිටියද කියලවත් නෑ. ඒක ආරම්භ කරන කොට. මම සභාපතිවරයා විදියට ඒ උත්සවයට සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරා. ඒ වගේම ඵලකයේ සියලුම මන්ත්‍රීවරුන්ගේ නම ගැහුවා. මන්ත්‍රීවරු විසිදෙදෙනාගේම නම් සඳහන් කරා. ලේකම්තුමා ප්‍රධාන නිලධාරින්ගේ ආරාධනය පවා සඳහන් කරා. වෙනදට වැඩිය අපහසුයි. ඉස්සර 11 දෙනයි. දැන් 22 මන්ත්‍රීවරු. කිසිසේත්ම මන්ත්‍රීවරුන්ගේ ගෞරවය අවතක්සේරු කරලා නෑ. සභාවේ තියෙන අයිතිය කොයිවෙලාවකවත් සභාපතිවරයා විදියට නැති කරන්නේ නෑ. පක්ෂ භේදයෙන් අපි මොන දේ කතා කරත් සභාවේදී නම් මගේ පක්ෂ පාට භේදයක් නෑ.

**(සභාව තේ පානය සඳහා කල් තබන ලදි.)**

(තේ පානය අතරතුරදී ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම හා ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගීවීම සිදුවිය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-**

01. ගාල්ල වටරක -නැගෙනහිර ප්‍රදේශවාසී 04 දෙනෙකු ( කේ. එච්. ධනුෂ්ක, එච්. කේ. කරුණාතිලක, ජේ. ඒ. එන්. සමන්, එච්. ඩී. එස්. ගීතික ) ඉදිරිපත් කර ඇති ලිපිය

මාර්ගයක් කොන්ක්‍රීට් කිරීම/ තාර දැමීම පිළිබඳ

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ප්‍රමාණය කොච්චරද? පෞද්ගලික ඉඩමක්ද? වෙන්දේසි ඉඩමක් ද? මොකද්ද මේ?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කාර්මික නිලධාරින් ලවා පරීක්ෂා කරලා බලලා තීරණයක් ගමු ඉදිරියට.

02. අධ්‍යක්ෂක පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය - පළාත් පාලන ආයතන වල මහජන නියෝජිතවරුන් සඳහා වන පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව. -2019 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම.

මේ පාඨමාලා හදාරන්න කැමති අය අද දිනය වන විටම මෙහෙට නම් ලබා දෙන්න. රු. 60,000.00 යි ගාස්තුව ඒක සභාවෙන් ගෙවන්න පුළුවන්.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ සුදුසුකම් තියෙන මේ පාඨමාලාව හදාරන්න කැමති අය අද දින අයදුම්පත්‍ර භාර දෙන්න.

03. චමින්ද ජී. පී. ගුරුගේ මයා - පිඹුරු අංක 1705 සැලැස්මේ දැක්වෙන ඉඩමට වූ නීත්‍යානුකූල ප්‍රවේශ මාර්ගය පැහැදිලි කරදෙන ලෙසට කරන ඉල්ලීම.

ඒක බොහෝ මන්ත්‍රීවරු දන්නවා වක්වැල්ල ප්‍රදේශයේ පවත්නා පාරක් වහලා වෙනත් පාරක් ලබා දීමේ ප්‍රශ්නය. අපේ කාර්මික නිලධාරින් යවලා මම ඒ පාර පරීක්ෂා කරා. එතනදී ඒ පාවිච්චි කරපු මාර්ගය නෙමෙයි ඇත්ත මාර්ගය. ඇත්ත මාර්ගය වංගු සහිත මාර්ගයක්. පාවිච්චි කරලා තියෙන්නේ ඍජු ප්‍රවේශ මාර්ගයක්. දැන් සභාවේ අපි අද තීන්දුවක් ගන්න ඕන. මම දරණ මතය නම් මේක සභාව විදියට අපි මිනින්දෝරු මහත්තයෙක් යෝජනා කරලා ඒ අය එකගයි මිනින්දෝරුවට යන වියදම දරන්න. මම දකින්නේ ගොඩක් තැන්වල වැරදි අඩුපාඩු තියෙනවා. මන්ත්‍රීවරුන්ට ඇවිත් කියන අයත් සර්වසාධාරණ අය නෙමෙයි මෙතනදී. හැමෝගෙන්ම වැරදි සිදුවෙලා තියෙනවා මම දකින විදියට. එතනදී අපිට පුළුවන් මිනින්දෝරුවෙක් ලවුවා ඒ සියලු ඉඩම් ටික මැනලා පාර පැහැදිලි කරලා දෙන්න.

( සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා මේ පාරේ ඉදිකිරීම් කරපු තාප්පෙට සභාවෙන් අනුමැතිය දීලද තියෙන්නේ?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. අපි ඒක නවත්තලා තියෙන්නේ.

( සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා, දැන් වැඩේ තියෙන්නේ මිනිස්සු දැන් ඒගොල්ලන්ගේ ඉඩම් තියෙන නිසා දැන් මෙහෙම පාවිච්චි කරනවා. මේ සභාවෙන් ලයිට් පවා දාලා තියෙනවා. පාවිච්චි කරපු පාර පැහැදිලිවම තියෙනවා. දැන් මේ දාලා තියෙන චිත්‍රයේ විදියට පෙන්නලා තියෙන පාර ගියාම වෙනස්. මම හිතන්නේ අද දවසේ ඒ ප්‍රශ්නය ඒවි මෙතනට. සර්වේ ලයින් ගිහිපු පාරක් තියෙන්නේ මේකේ. ඒ වගේම වංගු වංගු දාලා තමයි තියෙන්නේ. මෙතන තියෙන්නේ ඒ විදියට. ඉඩම් කැල්ල විකුණන කොට මේක බැලුවේ නෑ. ලයිට් පවා දාලා තියෙනවා බොහොම පැහැදිලිව යන පාරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක අධිකරණයට ගියපු කාරණාවක්. අපි සභාවෙන් ඉඩම් කැබැල්ලක් අනුමත කරලත් තියෙනවා. ඒක ඒ ඍජු පාර නෙමෙයි. Plan එකේ තියෙන්නේ අංශක කිහිපයක් ආනතියක් තියෙන පාරක්. එතන එහෙම නම් මම දකින විදියට අධිකරණයටම යන්න ඕන. මේක අපි මෙච්චර කල් පාවිච්චි කරපු පාරක් කියලා අධිකරණයෙන් බේර ගන්න ඕන. සභාවට පුළුවන් පවත්නා පාර සලකුණු කරලා දෙන්න විතරයි. ඔක්කොම එකග වෙනවා කෙලින් පාර නෙමෙයි කියන එක. නමුත් ඒගොල්ලෝ කියන්නේ පාර කැට ගල් අල්ලලා තියෙනවා ලයිට් දාලා තියෙනවා. නමුත් එක ගෙදරකට පාවිච්චි කරපු හින්දා ඒගොල්ලෝ එහෙම කරලා තියෙනවා. ඒ ඉඩම කැබලි කරලා විකුණවට පස්සේ වෙනත් කාරණාවක් දැන් මතු වෙලා තියෙනවා.

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ පාර පාවිච්චි කරලා තියෙන කාලය බැලුවම මරණ පවා ගෙනියලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සභාපතිතුමා, මේක බැලුවම පේන්නේ පෞද්ගලික ඉඩමකට යන පාරක ප්‍රශ්නයක්. මේක ඉඩම් හිමියන් සියලු දෙනා එකග නම් එකග වෙලා මැනගන්න පුළුවන්. නමුත් විරෝධතාවයක් තියේ නම් මේකට අධිකරණය හරහා තීන්දුවක් ගන්නවා මිසක් අපිට තීරණය ගන්න බෑ. සභාව හැටියට අපිට පොදු පාරක් නම් පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ මන්ත්‍රීතුමා මම බැලුවෙ මෙහෙම. විරුද්ධ පාර්ශව ඉන්න පුළුවන්. මම බැලුවේ සභාව මැදිහත්කරු වෙන්න. තිබුන පාරෙ තාප්පයකුත් ගහනවා. තාප්පයත් අනවසරයි. දැනට අපි ඒක නවත්තලා තියෙන්නේ. නමුත් මම බැලුවේ ඒ ඉල්ලපු අය එකඟයි යන වියදම ඒගොල්ලෝ දරන්න. මිනින්දෝරුවට යන වියදම ඒගොල්ලෝ දරන්න. මම බැලුවේ අපි මිනින්දෝරුවෙක් යෝජනා කරලා මනින්න. එතකොට ඒගොල්ලෝ මුදල් ගෙවාවි. ඒ ඉඩම් කැබලි ඔක්කොම එක්ක මනින්නේ. කාටහරි ප්‍රශ්නයක් තියෙනවා නම් අපේ මැනුම පිළිගන්න බැරි නම් එකම දේ අධිකරණයට යන්න පුළුවන්. ඒ නැතිව බොරුවට අපි උසාවි යනවා ඒවා කිය කිය ඉන්න ඕන නෑ. නැත්නම් මේක දිගින් දිගට යනවා. මම පැහැදිලිවම දන්නවා ඔය කියන අයත් ඉඩම් අල්ලන් ඉන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ප්‍රශ්නෙ නීත්‍යානුකූලභාවය පිළිගන්න ඕන. මේකෙ ඇතුලේ ප්‍රශ්නයක් තියෙන්න පුළුවන්. කවුරුහරි කෙනෙක් තමන්ගේ ඉඩමේ ප්‍රමාණයට වැඩිය මායිම් වෙනස් කරලා තියෙන්න පුළුවන්. අපිට ආයතනයක් විදියට මැදිහත් වෙන්න පුළුවන්. ආයතනයක් විදියට අපි මැදිහත් විය යුතු ආකාරය නිවැරදි කරගත යුතුයි. එහෙම නැතිව අපිට ගිහිල්ලා ඉඩම් මනින්න අයිතියක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අධිකරණයට යන්න කවුරුවත් නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙම නම් ආරවුල අපිට යොමු කරන්නේ නැතිව පොලීසියට ගිහින් ඒගොල්ලෝ බේරා ගන්න ඕන. අනවසර ඉදිකිරීම නවත්තන එක අපිට පුළුවන්. පාර අපිට පවරපු පාරක් නෙමෙයි නම් අපිට ගිහින් පාර මැනලා වෙන් කරන්න අපිට අයිතියක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන මන්ත්‍රීතුමා මෙහෙමයි. අනවසර කියන්නේ අපෙන් අවසර අරන් නැති එක. නමුත් Plan අනුව බැලුවම ඒ ඉදිකිරීම හරි. මම කියන එක තේරුම් ගන්න. ඒ ඉදිකිරීම හරි එකක් කියලා නෙමෙයි මම කියන්නේ. ඒක වැරදි මතයක්. ඒකට අනුමැතිය අපෙන් ඉල්ලුවොත් අපිට දෙන්න වෙනවා.

(සභාව ඝෝෂාකාරි විය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාප්පෙට අනුමැතිය ඉල්ලුවොත් අපිට දෙන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තමන්ගේ ඉඩම වටා ආරක්ෂිත තාප්පයක් ඉදිකරන කොට අවසර ගන්නේ කවදාහරි පාර ලොකු කරද්දී වන්දි ගෙවන නිසා. පාර ලොකු කරද්දී පවරා ගැනීමක් කරන කොට අවසර අරගෙන නැත්නම් වන්දි ගෙවන්නේ නෑ. මගේ ඉඩමේ ආරක්ෂාවට වැටක්, තාප්පයක් ගහන්න මට අයිතියක් තියෙනවා. එම පෞද්ගලික දේවල් වලට මැදිහත්වෙන්න අපිට අයිතියක් තියෙනවද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක් ගැනද?.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පාර දෙපැත්තේ තියෙන්නේ පෞද්ගලික ඉඩම්. පෞද්ගලික ඉඩම් වල අයිතිකාරයන් තමන්ගේ ඉඩම් වල මායිම් වෙනස් කරන්න සූදානම් නැත්නම් අපි ගිහින් මැනලා ගන්න ප්‍රතිඵලය මොකද්ද?. එයාලා එකඟ වෙන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ මන්ත්‍රීතුමා. අපිට ශත පහක්වත් යන්නේ නෑ සභාවෙන්. ඒ පාර්ශව සියලු දෙනා ඒකට එකඟයි. පොදුවේ සියලු ඉඩම් ඔක්කොම මැනලා පාර ලකුණු කරලා දෙනවට එකඟයි. ඉන්නේ පවුල් 05 යි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පස් දෙනා එකඟ නම් කමක් නෑ. අපි මැදිහත් වෙන්න ඕන නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ එකිනෙකා අතර අර්බුද තියෙනවා. එක තැනකට පස්දෙනා එන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ පස්දෙනාම කැමතිද අපි මැදිහත්කරු වෙනවට. එහෙම නම් ලිඛිතව ඒගොල්ලන්ගෙන් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එක් කෙනෙක් අත්සන් කරලා නෑ. එයාට ප්‍රවේශ මාර්ගයක් ඕන නෑ. එයාට ප්‍රධාන පාර තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එයාගේ මායිමෙනේ පාර තියෙන්නේ. එයා මායිම වෙනස් කරන්න කැමති නැත්නම්?.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මැදිහත් වුනොත් මධ්‍යස්ථයිනේ. ඒක කවුරුත් පිළිගන්නවා. අපි මිනින්දෝරුවෝ දාලා මනිනවා. ඒගොල්ලෝ ගෙවනවා. ශත පහක්වත් සභාවෙන් වියදම් වෙන්නේ නෑ. අපි වැඩේ කරාම විරුද්ධ නම් කවුරුහරි අපි එයාට අධිකරණයට යන්න කියනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපේ නෛතික සීමාව අපි මුලින් අවබෝධ කරගන්න ඕන. මේක පුද්ගලික කාරණයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා මට මේක ඉවර කරන්න විදියක් කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ සියලු පාර්ශ්වයන් මැදිහත්කරු වශයෙන් සභාව පිළිගන්න කැමති නම්, ඒ පස්දෙනාම කැමති නම් පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පාර්ශ්ව දෙකක් ආවා දෙවිදියකට. පස් දෙනාගෙන් දෙන්නෙක් එක විදියක්. තුන්දෙනෙක් එක විදියක්. මම පැහැදිලි කරලා දුන්නා තත්වය.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒ කිවුවම පාර්ශ්ව දෙකම එකඟ වුනා. හැබැයි වැඩේ කරන්න යද්දී විරුද්ධ වෙයිද දන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ලිඛිතව ගන්න. මේක සභාව මැදිහත් වෙන්න ඕන ප්‍රශ්නයකුත් නෙමෙයි.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපේ සභා බල ප්‍රදේශය තුල පාරක් සම්බන්ධව ගැටලුවක් මතු වුනාම ඒක ගහමරාගන්න තත්වයකට යන්න ඉස්සෙල්ලා ඒක ඉල්ලීමක් කරලා තියෙන නිසා සභාව මැදිහත් වෙන්න කියලා ඒකට මැදිහත් වෙන්න. ඒගොල්ලෝ ගෙවීම් කරනවා. අපිට ගෙවීම් කරන්න අවශ්‍යතාවයකුත් නෑ. මේ වගේ ප්‍රශ්නයක් ආවම කරන්න තියෙන්නේ ඒගොල්ලොන්ගේ ඉල්ලීම අනුව මැදිහත් වෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඉන්නෙත් ඒ මතයේ. දෙපාර්ශ්වය එකඟ වුනා නම් අපිට, සභාවට හානියක් වෙන්නේ නෑ. මුදලක් වියදම් වෙන්නෙත් නෑ. ඔක මන්ත්‍රීතුමා මෙහෙමයි. අපිට මුදල් වියදම් කරන්න පුළුවන් නම් කිසි ප්‍රශ්නයක් නෑ. අපි දාලා මැන්නා අධිකරණයට යන්න ඕන නම් යනවා. එහෙම ඕන නැනේ දැන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එතනදී යම් කිසි පාරකට අවහිරතාවයක්, පාර්ශ්වයකට අවහිරතාවයක් තියෙනවා නම් සභාවට පුළුවන් ඒ පාර්ශ්වය එක්ක කතා කරලා එකඟතාවයකට එන්න. සභාවේ එකඟතාවය අරගෙන ඒ මිනිස්සුන්ටත් අසාධාරණයක් නොවන විදියට ඒ ප්‍රශ්නය ලේසියෙන් විසඳන්න පුළුවන්.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා මෙහෙමයි. අපිට වට මැනලා ඉඩම් කැබලි මනින්න නෙමෙයි තියෙන්නේ. මේක මූලික ප්‍රශ්නය භාවිතා කරපු පාර ඉල්ලන එක. එයාලගේ පුද්ගලික දේපල මැනලා හදලා දෙන්න අවශ්‍යතාවයක් නෑ. ඒක එයාලා අදාල පාර්ශව හරහා කරගත යුතු දෙයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ඉඩම් ටික මනින්නේ නැතිව පාර මනින්න බෑ.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සභාපතිතුමා, මේ පාර අවුරුදු කීයක් පරණයි කියලද ඔබතුමා හිතන්නේ. ඒ පාරට මේ සභාවෙන් කණු දාලා වීවී පහන් පවා දාලා තියෙනවා. භාවිතා කරපු පාර ප්ලෑන් එකක් හරහා වෙනස් වෙන්නේ ඉඩම් අයිතිකාරයා තව පාර්ශ්වයන්ට කොටසක් විකුණපු නිසා. නැත්නම් ලයිට් දාලා පාර කොන්ක්‍රීට් කරාවි සභාවෙන් ගිහිල්ලා. ඒවගේ අවස්ථාවක් තමයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඔබතුමිය කියන්න මොකද්ද සභාවේ අයිතිය.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** පාරක් කෙනෙක් භාවිතා කරනවා නම් සභාවෙන් ගිහින් ලයිට් දාන්නත් පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මන්ත්‍රීතුමිය අපිට පුළුවන් නීත්‍යානුකූල දේ කරන්න විතරයි. අපේ සභාවට දාලා ගේකුත් අනුමත කරලා තියෙනවා. සෘජු පාරක් නෙමෙයි තියෙන්නේ. යම් ආනතියක් තියෙන දෙවෙනියට තියෙන පාර තමයි ඒ.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- ඒ පාර ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමක් කරලා තියෙනවද ගැසට් කිරීමක් කරලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- නෑ.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය** ඃ- මම යෝජනාවක් කරලා තියෙනවා සභාවේ පාරවල් ගැසට් කරන්න කියලා. සෑහෙන්න පාරවල් තියෙනවා ගැසට් නොකරපු. දැන් සභාපතිතුමා දැනුම් දීලා තියෙනවද ඕකේ ළිඳක් කපලා ඉවර වෙලා බට ලයින් එකක් කැඩිච්ච එකක් සම්බන්ධව. සභාවේ අවසරයක් නැතිව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- සභාවේ අවසරයක් ඕන නෑ ළිඳක් කපන්න. දැන් ඒ පාරට ඒ ඒ පාර්ශවයන්ට පුලුවන් අධිකරණයට යන්න. අපිට බෑ. ඒක තේරුම් ගන්න. ඒ පාවිච්චි කරපු පාර මිනිස්සු ඉල්ලනවානම් ඉල්ලන මිනිස්සු යන්න ඕන අධිකරණයට. අපිට බෑ. ප්ලෑන් එකේ තියෙන පාර තමයි අපි පිළිගන්නේ. පාවිච්චි කරපු පාරට වීථි පහන් දැම්මා කියනවා. විදුලි කණු දැම්මා කියලා ඔබතුමිය කියපු දේ වැරදියි. විදුලි කණු දැම්මේ අපි නෙමෙයි. විදුලිබල මණ්ඩලය. ඒවා කරේ ඒ අය. සභාවෙන් ලයිට් දාන්න ඇති. අපිට පුලුවන් සභාව විදියට කියන්න ප්ලෑන් එකේ පාර තමයි කියලා. පාවිච්චි කරපු පාර ඕන නම් අධිකරණයට ගිහින් අයිතිය ඉල්ල ගන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා** ඃ- සභාපතිතුමා මෙතන සරල කාරණයක් තියෙන්නේ. මේ සියලු පාර්ශවකරුවන් එකඟ නැත්නම් මිනින්දෝරු මහත්තයෙක් ඒක මනින්නේ නෑ. ලයිෂන් එක කැන්සල් වෙනවා මැන්නොත්. එයා මනින්නේ නෑ. එහෙම මනින්න බෑ. උසාවියට ගිහින් කිවුවොත් අහවල් මිනින්දෝරු මහත්තයා ඇවිත් මගේ ඉඩම බලෙන් මැන්නා කියලා එයගේ ලයිෂන් එක කැන්සල් වෙනවා. ඒක නිසා මේ සේරම කට්ටිය එකඟනම් මේක මැනගන්න පුළුවන්. එහෙම නැත්නම් කරගන්න බෑ. උසාවි යන්න ඕන. ඒක තමයි සරලම කාරණාව.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දැන් ඔබතුමා දන්නවාද මේක අධිකරණ තීන්දුවක් දීපු පාරක්. මේක වෙනස් කරන්නේ කොහොමද කියන්න. දීලා තියෙන්නේ භාවිතා කරපු පාර නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ඒ දුන්නට පස්සේ අවුරුදු කීයක් පාවිච්චි කරලා තියෙද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එහෙනම් අධිකරණයට ගිහින් පාර වෙනස් කරගන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- අනවසර ඉදිකිරීම ඉවත් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මේ පාර අනුව එයාලා තාප්පයට අවසර ඉල්ලුවොත් අපිට දෙන්න වෙනවා. කැබලි සැලැස්මත් අනුමත කරලා තියෙන්නේ. ගේ අනුමත කරලා තියෙන්නේ. මේ දීපු තීන්දුවත් එක්ක පාර යන්නේ මේ විදියට. මේ අධිකරණ තීන්දුව නැවත වෙනස් වෙන්න ඕන නම් මේ පාර මෙච්චරකල් භාවිතා කරා කියලා අධිකරණයට යන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- අපිට බෑ පාවිච්චි කරපු පාරක් වෙනස් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක ඔබතුමාට මට කියන්න බැනේ. අධිකරණ තීන්දුවකින් විතරයි ඒක බලාගන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- අනවසරයෙන් තාප්පයක් ගහන්න බැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක හරි.

(සභාව පැහැදලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මම ඒක තමයි කිවුවේ. මම ඒක නවත්තලා තියෙන්නේ. ඒ ගොල්ලෝ අවසර ඉල්ලුවොත් බොහෝවිට දෙන්න වෙනවා. දැන් තාප්පේ ගහන්නේ

මායිමේ. ඒගොල්ලෝ අනුමත කරපු ප්ලෑන් එකේ මායිමේ. ඒකට තාම අවසර ඉල්ලලා නෑ. අනවසර හින්දා නවත්තලා තියෙනවා.

(සභාව පැහැදිළි නොවිය)

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා තාප්පේ ඉදිකිරීම නවත්තලා නඩු මාර්ගයකට හරි, වට මනින එකකට හරි එකඟතාවය අරගෙන කරගන්න වෙන්නේ. ඒ පාර්ශවය ඒක කර ගනිවී. අපිට තියෙන්නේ ඉදිකිරීම නවත්වන එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට බැරි එකම දෙයයි. වාරණ නියෝගයක් ගත්තොත් ඒ තාප්පයට විරුද්ධව අපිට අනුමත කරන්න බෑ. නැතුව ඒ මිනිස්සු ප්ලෑන් එකක් දැම්මොත් අපිට අනුමත කරන්න වෙනවා.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඒක පැහැදිලියි. සභාපතිතුමා අසාධාරණ තීරණයක් අරගෙන නෑ. ඒක පැහැදිලියි. මම කියන්නේ ඒ ප්‍රශ්නය විසඳගත යුත්තේ එයාලා. ඒ නඩු මාර්ගයකට ගිහිල්ලා වට මැනලා අයිතිවාසිකම් පෙන්නලා ඒ ආකාරයෙන් ඕන සභාපතිතුමා ඒ වැඩ ටික කරන්න. තාප්පෙට තාම අනුමැතිය දීලා නැනේ. වතුර වලක් කපලා වතුර බටයක් යටවෙලා කියලා එතන ගැටලුවක් තියෙනවා. ඒක විසඳගන්න ඕන. තාප්ප ගහන එක දැනගනිපු ගමන් සභාපතිතුමා ඒක නවත්තලා තියෙනවා ඒකට බොහොම ස්තුතියි. ඒක නතර කරා කියලා මට කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙට පැමිණිල්ල එනකොට තාප්පෙත් වැඩ ටික ඉවරයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමාට පුළුවන් සභාපතිතුමා ඒ තාප්පෙට අනුමැතයි දෙනකොට දඩ ගහන්න.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒගොල්ලන් අපිට ඉල්ලීමක් කරොත් අනුමැතිය ඉල්ලලා පාර ආනති විදියට හදන්න කියලා ඉල්ලීමක් කරන පුළුවන් සභාව විදියට. මේකට අපි මොකද කරන්නේ පාරක් මැනලා දෙන්න කියලා කරපු ඉල්ලීමට.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙතනදී නීතිය අනුව අපි තේරුම් ගතයුතු කාරණයක් තියෙනවා. බලප්‍රදේශය පදිංචි පුරවැසියන්ට ඔවුන්ගේ ප්‍රවේශ මාර්ගයක් ගැන ගැටලු ඇති වුනාට ඕවා නිරවුල් කර දීමට සභාවෙන් ඉල්ලීමක් කරන්න ඒ පුරවැසියන්ට අයිතියක් තියෙනවා. ඒකට මැදිහත් වීම සභාවේ වගකීම. ගැටුමක් වළක්වගෙන දීර්ඝකාලීන අධිකරණ ක්‍රියාමාර්ගයකට යන්නෙ නැතිව සරල ක්‍රමේකට මේක විසඳගන්න තමයි සභාවේ උදව්ව මේ පදිංචිකරුවන් බලාපොරොත්තු වෙලා තියෙනවා. ඒකට මේ ලිපියක් යොමු කරලා තියෙනවා. මෙතන නමුත් සභාපතිතුමා කිවුවා වගේ සැලැස්මකදී මේ ඉඩම් කැබලි වල මැනීමකුත් සිදු වෙනවා නම්, මේ ඉඩම් කැබලි මැනීම සිදුකර පාර මැනීමද සිදුකල යුතු බව තමයි සභාපතිතුමා ප්‍රකාශ කරේ. මෙතනදී අපිට වෙන ගැටලුව තමයි, එක ඉඩම් හිමියකු මේකට අත්සන් තබලා නෑ. අපි විශ්වාස කරනවා ඒ ඉඩම් හිමියා මේ කාරණයට එකඟ නැති නිසා මේ ලේඛණය අත්සන් තබලා නෑ කියලා. එතකොට අපිට පාර නිර්ණය කරන්න යද්දී ඒ ඉඩම් හිමියාගේ ඉඩම් කැබැල්ල මැනිය හැකිද කියලා නීතිමය ගැටලුවක් මතු වෙනවා. නමුත් ඒ ඉඩම් කැබැල්ල තියෙන්නේ පාරෙ මායිමෙන් පිට. පාරේ අවසන් ඉඩම් කැබැල්ල. එතනදී පාරේ පළල හෝ පාර නිර්ණය කිරීම සඳහා ඒ ඉඩම් කැබැල්ල මැනීමකින් තොරව වුනත් සිදුකල හැකි බව පේනවා. අවසන් කොටසේ ඉඩම් කැබැල්ල අයිති කෙනා තමයි අත්සන් කරලා නැත්තේ. ඒ ඉඩම මනින්නේ නැතිව පාර නිර්ණය කරන්න පුළුවන්. ඒ නිසා අපිට මේ මැදිහත්වීම සානුකම්පිතව සලකා බලා සභාවක් හැටියට මිනින්දෝරු මහත්තයෙක් මේකට සම්බන්ධ කරලා දීලා ඒ ඉඩම් කැබලි හිමියන්ට පාර මැනගෙන ඒ මිනින්දෝරු මහත්තයා ඉදිරිපත් කරන සැලැස්ම මේ සැලැස්මට යම්කිසි පටහැනිබවක් ඇති කරනවා නම්, ඒ පිළිබඳව දෙපාර්ශ්වයම එකඟ විය නොහැකි නම්, යම්කිසි පියවරක් ගන්න කටයුතු කරන්න කියලා සහතිකයක් දීම තමයි හොඳ.

මේකට අපෙන් මුකුත් වියදම් වෙන්නෙත් නැනේ. ඒ වගේම මාර්ගයක් සකසන්න හෝ භාවිතා කරන මාර්ගයක ගමන් පහසුව සඳහා මාර්ගය කොන්ක්‍රීට්, තාර කැටගල් ආදී යම්කිසිවක් අතුරන එකත්, ඒ මාර්ගයේ රාත්‍රියේ මිනිසුන් ගමන් කරනවා නම්, ගමන් පහසුව හා සොර සතුරු බිය ඉවත් කිරීම සඳහාත් වීථි ලාම්පුවක් යෙදීම ඒ තරම් නීතියෙන් ලොකු අයිතියක් දෙන කාරණයක් නෙමෙයි. ඒ නිසා අපි ඒ මිනිස්සුන්ට විසඳගන්න අවස්ථාවක් දෙමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මගේ අදහස නම් මෙතනදී අපි සියලු දෙනා මැදිහත් වෙන්න ඕන සද්භාවයෙන් පක්ෂ පාට භේද නැතිව. මම දකින දේ කියන්නේ මේ. මේ ඉල්ලීම සාධාරණයි. මෙයාලා ඉල්ලන්නේ මුළු ඉඩම් ඔක්කොම මැනලා පාර වෙන් කරලා දෙන්න. අපිට මේක

සද්භාවයෙන් මැදිහත් වෙලා මේ සියලු දෙනාම එක තැනකට ඇවිල්ලා දෙගොල්ලොන්ම කැමති මිනින්දෝරුවෙක් දාලා මුලු ඉඩම් ටික මැනලා ඇයි මේ දේ කරන්න බැරි?. කවුද අකමැති හේතුව වෙන මුකුත් නෙමෙයි. කොටසක් අල්ලන් ඉන්න කෙනා තමයි අකමැති.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පෞද්ගලික ඉඩම් ආරවුලකට ඇයි අපි මැදිහත් වෙන්නේ. එයාලට කියන්න සමථ මණ්ඩලයට ගිහින් මේක බේර ගන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපෙන් ඉල්ලීමක් කරොත් දෙපාර්ශ්වයක් අපි කියනවා නම් සමථ මණ්ඩලයට යන්න කියලා සභාවක් ඕන නැනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මොකද්ද එහෙම කරන්න තියෙන අයිතිය?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මුකුත්ම අයිතියක් නැත්නම් සභාවක් කියන්නේ මොකද්ද?

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉඩම් ආරවුලට මැදිහත් වෙන්න සභාවට අයිතියක් නෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක පෞද්ගලික ප්‍රශ්නයක්. ඔබතුමාට ඇවිල්ලා ඉල්ලීමක් කරානම් ඔබතුමා මැදිහත්වෙලා ඒක විසඳලා දෙන්න. ඇයි මේක සභාවට දැම්මේ?. සභාවට තියෙන කාර්යභාර්ය මොකද්ද?.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒගොල්ලෝ බොහොම සද්භාවයෙන් කියනවා සභාව මැදිහත් වෙන්න. ඒගොල්ලෝ මිනින්දෝරු ගාස්තු ගෙවනවා කියලා. මේ පාර්ශ්වයන් එකතැනකට සම්බන්ධ කරන්න පුළුවන් වෙලාවේ ඇයි අපි කියන්නේ ඔයගොල්ලො යන්න පොලීසි, උසාවි අපිට මැදිහත් වෙන්න බෑ කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා මේ ලියුම සභාවට දාලා සභාවෙන් බලාපොරොත්තු වෙන්නේ කුමක්ද?.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ ප්‍රශ්නය පැය ගාණක් දුරට ගෙනියන්න දෙයක් නෑ. මේ පොඩි කාරණයක් තියෙන්නේ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේක යම්කිසි දවසක සභාවට හම්බවෙන පාරක්. ඒ මිනිස්සුන්ට ඇනකොටා ගෙන මරාගන්න දෙන්නෙ නැතිව මේ ඉල්ලීම ඉෂ්ට කරලා දෙන්න. සභාව වියදම් කරන්න ඕන නෑ. වියදම් කරන්නේ ඒ මිනිස්සු. සභාව මැදිහත් වෙන්න.

(සභාව සෝෂාකාරි විය)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක පෞද්ගලික මායිම් පිළිබඳ ප්‍රශ්නයක්. මේකට ඉල්ලීම් කරලා තියෙනවා නිරවුල් කරලා දෙන්න කියලා. අපිට ඒ පාර සභාවට පවරලා නැතිව ඇති. ගැසට් කරලා නැතිව ඇති. ඒත් සභාවට වගකීමක් තියෙනවා පාර සම්බන්ධව. ඒ පාර අවහිර වුනොත් අපිට මැදිහත් වෙන්න පුළුවන් සභාව විදියට. ඒකට මේක සභාවට දාලා අවසර ගන්න ඕන නෑ. මේක පරිපාලන කටයුත්තක්. ඒක ඔබතුමා දන්නේ නැත්නම් මට කරන්න දෙයක් නෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක සභාවට දාලා අනුමත කරගන්න ඕන නෑ. ඔබතුමා මැදිහත් වෙලා ඒක විසඳලා දෙන්න. ඒක තමයි වඩාත් හොඳ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා, මේක මට පුද්ගලිකව විසඳන කාරණාවකට වැඩිය, ඒ අය මුදලක් වියදම් කරන නිසා අපි සභාව විදියට මධ්‍යස්ථව ඉදලා මේක බේරලා දෙමු. එහෙම වුනොත් මේ ප්‍රශ්නය ඉවර වෙනවා. වසන්ත මහත්තයා එකඟ කරගන්න

සම්පූර්ණ ඉඩම් ටික මැනලා පාර ලකුණු කරගන්න තැනට. ඒක කරලා දුන්නොත් මේ වැඩේ ඉවරකර පුළුවන්.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඒක මම භාර ගතයුතු ප්‍රශ්නයක් නෙමෙයි. තුන්දෙනෙක් ඉදිරිපත් වෙලා මට මේ ප්‍රශ්නය කියද්දී මට එක්කෙනෙක් දිහා බලන්න බෑ. මම කිව්වා පාර ගැන සම්බන්ධ ක්‍රියාමාර්ගය අපිට ගන්න පුළුවන්. පාරෙ යම් කොටසක් ඒ නිවෙස ඉදිකරපු අය අල්ලගෙන තියෙනවා නම් අපිට පුළුවන් ඒ හා සම්බන්ධ කටයුතු කරලා කඩලා හරි ඉවත් කරන්න. ඊට වඩා පෞද්ගලික ආරවුලක් නම් ඒවා විසඳන ආයතන තියෙනවා ඒවට ගිහින් විසඳගන්න. එහෙම තමයි මම ඒ කට්ටියට කිව්වේ. පොලීසියට ගියපු ප්‍රශ්නයක් මේක. සභාවට පොලීසියනුත් දැනුවත් කරපු බව එයාලා කිව්වා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ මෙහෙමයි. වසන්ත මහත්තයට පාර ප්‍රවේශයක් එන්නේ නෑ. එතුමට තියෙන්නේ ප්‍රධාන පාර. එතුමට පාර අයිතිම නෑ. ඒකේ එතුමට තියෙන්නේ මායිම පිළිබඳ ප්‍රශ්නයක්. පාරෙ ප්‍රශ්නයක් නෙමෙයි. මේක හින්දා මිනින්දෝරුවෙක් ලවා එතුමගේ මායිම නිරවුල් කරගන්න ඕන.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඒක එතුමගේ පෞද්ගලික ප්‍රශ්නයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා කියන්නේ අවුරුදු ගානක ඉඳන් මම ඒ යෝජනාව එයාලට කරා. ඒවෙලේ අකමැති වුනා. ඒ නිසා මම දැන් කැමති නෑ කියලා.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මට කාටවත් පක්ෂග්‍රාහි වෙන්න බෑ. ඒ පාර්ශව වලට කියන්න කැමති වෙලා කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අයට කියලා ඒ අයගේ එකඟතාවය මත මධ්‍යස්ථ මිනින්දෝරුවෙක් දාලා මනින්න කියමු.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** කවුරුත් එකඟතාවයෙන් ප්‍රශ්නය විසඳගන්න කියමු. ඒක එයාලගේ පෞද්ගලික ප්‍රශ්නයක්නේ.

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** භාවිතා කරන පාරක් පවතිනවා නම්, ඒ පාර ජේන්න තියෙනව නම්, ඒක හරහා තාප්පයක් ගහනවා නම්, ඒක නීත්‍යානුකූල කරන්න යන්න එපා. මේක ගැන නෙමෙයි මම කතා කරන්නේ. මේ ජේන පාර තමයි තිබුනේ. ඉඩම විකුණපු මිනිස්සු මේ පාර වැරදියට පෙන්නපු නිසා තමයි මේ ප්‍රශ්නෙ ආවේ. නමුත් වැඩේ තියෙන්නේ මේ මිනිස්සු පාවිච්චි කරේ මේ පාරනෙ කොහොම හරි. ඒක හින්දා මින් ඉස්සරහට හරි මේ දේ වෙන්න දෙන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙ වෙලා තියෙන්නේ තනි පුද්ගලයෙක් ඉද්දී ඒ පාර පාවිච්චි කරා. එයා ඉඩම දෙකට බෙදලා යද්දී ඒ පාර පාවිච්චි කරාම ප්ලෑන් එකේ තියෙන පාර ඒක නෙමෙයි. ඒක වෙන් කරගෙන යද්දී පාවිච්චි කරපු පාරෙනුත් පර්චස් 02 ක් එක්ක තමයි විකුණලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වැඩේ තියෙන්නේ ඒ මිනිස්සු ඔය පාර පෙන්නලා තමයි විකුණලා තියෙන්නේ ඉඩම්. අන්තිම කැල්ලනෙ මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-**

04. රිම්සාන් වඩූඩ් - පරමියාගොඩ මාර්ගය සඳහා " අබ්දුල් වඩූඩ්" යන නාමය යෙදීම.

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ගුණරත්න හපුතන්ත්‍රි මහත්මයා ලිපියක් එවුවද පාරක් සම්බන්ධව.

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මීට ඉස්සෙල්ලත් ආපු ප්‍රශ්නයක් ඒක. අර ක්‍රේව් එක හදන්න තියෙන්නේ ඒකේ. ඒකෙ පොඩි දෙයක් අපිට කරන්න තියෙන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** උපසභාපතිතුමත් අහපු ප්‍රශ්නයක්. නරාවල පෝද්දල රණවිරු හපුතන්ත්‍රිගේ තාත්තා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පොඩි දේ නෙමෙයි ඉතින්. මම ඒක බලන්න ගියා. එතන ඔය කියන මනුස්සයා කණු ටික ගෙනල්ලා තියෙනවා එයාට යන්න පුළුවන් වෙන තැන වෙනකම්. මම මේක සභාවෙත් කිවුවා. ඔය කියන කෙනා කණු ටික පාරට අඩි 10 තියලා එයාට වාහනයක් ගන්න පුළුවන් වෙනකම් ගෙනාවා. අනෙක් මනුස්සයට අවහිර වෙන්න. ඒ මිනිස්සු කරපු වැඩේ තමයි ඉතුරු කණු ටික මායිමට වෙනකම් ගැහුවා පාරට අඩි 10 තියලා. එයා මායිම වෙනකම් කණු ටික ගෙනත් තිබුනේ. අනිත් මනුස්සයා කරේ ඉතුරු කණු ටික දැම්මා අඩි 10 වෙනකම්. ඒ දෙගොල්ලෝ අතර දීර්ඝකාලීන ප්‍රශ්න.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** වංගුව ටිකක් රවුම් කරලා දෙන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් මනුස්සයා එකග නෑ. අඩි 10 තියලා ගහලා තියෙන්නේ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය ආරවුල් වලින් 99% ක් මෙතනට එන්නේ පුද්ගලික ආරවුල්. එයා මායිම ගෙනාවා එයාට වාසි වන විදියට. අනික් පාර්ශ්වය ඉතුරු ටික ගැහුවා. කවුද පටන් ගත්තේ වැඩේ. දැන් ඊට පස්සේ මට අසාධාරණයි කිය කිය හැමතැනම යනවා. ඊට වැඩිය හොඳයි නම්‍යශීලීව අර මනුස්සයගෙන් ඉල්ලුවා නම් දේවි. එහෙම ඉල්ලන්නේ නෑ. පෙත්සම් ගහනවා ප්‍රාදේශීය සභාවට.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඔතනට ගියා. අනෙක් මිනිස්සු කිවුවෙත් ඒක. එකඟ වෙන්නේ නෑ. දෙගොල්ලෝ එක්කම සාකච්ඡා කරලා ඕනනම් අපිට විරුද්ධව උසාවි යන්න කිවුවා. මෙයා කිවුවා මේ දේ කරේ. මම ඇහුවම ඔව් කිවුවා. මම කිවුවා ඔයාට ඉතුරු ටිකත් ගහගන්න තිබුණා නේද කියලා. ඕක තමයි තත්වය.

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** - නැත

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-**

01. අප ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ ගාල්ල -වක්වැල්ල මාර්ගයට මුහුණලා ඇති තාප්පය අලුතින් ඉදිකිරීම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තාප්පෙ කඩන්න බෑ. කවුරු කොහොම මොනවා කිවුවත් අනිත් ඒවා කඩනකම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි. නමුත් තීන්දුවක් අරන් තියෙන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවේ පෞඪත්වය තියෙන්න ඕන මොන දේටත් කලින්. සභාව ඉස්සරහ පටුබව තියාගෙන මුකුත් කරන්න බෑ. එතන අවහිරයි. මාර්ග සංවර්ධන අධිකාරිය අනිත් පැත්තේ කාණු පද්ධතිය සකස් කරා. නමුත් මේ පැත්ත බැරි වුනේ අපේ තාප්පය අබලන් නිසා. මාර්ග සංවර්ධන අධිකාරියේ උපදෙස් මත අවශ්‍ය අඩි ප්‍රමාණය පස්සට අරගෙන ඉතුරු ටික කරන්න බලාපොරොත්තු වෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා ඔය වැඩේ ඔහොම කරන්න ඉන්නව නම් මොනවටද ලක්ෂ ගාණක් දීලා තව වැටක් ගැහුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වැට ගැහුවේ අඩි 10 ක් ඉඩ දීලා. පොඩි ළමයි අනාරක්ෂිත වෙන්න බෑ. පෙරපාසල නිසා එතන හැදුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඔය පාර පළල් කරන දවසට ඔය තාප්පය හදලා දෙනවා. ඔය තාප්පය විතරක් නෙමෙයි. අනෙක් තාප්පත්

හදලා දෙනවා. ඒකට ඉන්නවා ඇරෙන්න මට තේරෙන්නේ නෑ ඇයි මේ උවමනාව කියලා. මේ යෝජනාව ඉස්සරත් ආවා. මෙතන විතරක් පළල් කරලා දාන්නනේ හදන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනෙක් පැත්තෙන් ගත්තම ඇයි අපිට අපේ ආදර්ශය පෙන්නන්න බැරි ඉස්සරවෙලා. අපි අනුන්ට ඇඟිල්ල දික් කර කර කලේගාන හන්දියේ ඉදන් තාප්ප කඩන්න කියන්නේ නැතිව අපි මේ දේ කරමු. මාර්ග සංවර්ධන අධිකාරිය ඇවිත් ඉතුරු ටික පළල් කරන් ඒවි. මේක මන්ත්‍රීතුමා රජයේ දේපලක්. පුද්ගලික දේපලක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් ඔබතුමා හදන්නේ ආදර්ශය දීලා අනෙක් ටික කඩවන්නද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්. ඇයි බැරි කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ඒ වගකීම අරගෙන මේක කඩලා කොයිතරම් කාලෙකට පස්සේ අනික් ටික කඩාගෙන යනවද කියලා මට කියන්න. මම පෞද්ගලිකව මේ වැඩේට විරුද්ධයි. ඇයි මේ මාර්ග සංවර්ධන අධිකාරියෙන් කඩලා හදලා දෙන තාප්පෙ හදන්න අපි සල්ලි වියදම් කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මිනිස්සුන්ට පාර අවහිරයි කියලා තේරෙන්නේ නැද්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් කියයි කොහෙන් හරි සල්ලි හම්බවෙනවා කියලා.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාවක් මට අවශ්‍යයි. අබේසේකර මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයත් එක්ක මට මතක් වුනේ. මීට වසර 02 කට පමණ කලින් උළුවිටිකේ මහා විද්‍යාලය ඉදිරිපිට පස් කණ්ඩිය කපා ඉවත් කරලා තාප්පය හදලා විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා මීපාවල අමරසූරිය පාසල ගාව ඉදන් කිව්වා අනෙක් අයට ආදර්ශයක් වෙන්න මම පාර පළල් කිරීම ආරම්භ කරා. උළුවිටිකේ පාසල ගාව කියලා. දැන් ඉඩකඩ තියෙනවා දැන් යන්න පුළුවන්. ඒ නිසා මම කරේ. අනිත් අයත් තාප්ප කඩලා ඉඩදෙන්න කියලා මාර්ගය පුළුල් කිරීම සඳහා කියලා.

ඊළඟට අපේ සභාපතිතුමාගේ යෝජනාව වුනේ සභාව ඉදිරිපිට අලංකාර තාප්පයක් ඉදිකිරීම ආයතනයේ ආරම්භක ස්ථානයේ, ඇතුල්වෙන ස්ථානයේ පෞඨත්වයක් තිබිය යුතුයි. එතුමගේ යෝජනාව මම ස්ථිර කරනවා. අනිත් අයට ආදර්ශයක් වෙන්න ඕන. විශේෂයෙන්ම කලේගාන පොළ දවසට ඔතන සෑහෙන තදබදයක් තියෙනවා. ඒකටවත් ඉඩකඩ එන්න වාහන නවතා තියන්න පුළුවන් ආකාරයට ඉඩකඩ පහසුකම් අරගෙන. ඔය මුදල සභාවෙන් නොවේ නම් වෙන කොහොහොන් හරි අරගෙන කරනවා නම් මම ඊට එකඟයි. මම හිතනවා අපේ සභාවේ ගොඩක් මන්ත්‍රීවරු ඒකට එකඟ වෙයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙන් මම බලාපොරොත්තු වුනේ කාරණා 02 ක්. එක කාරණාවක් තමයි පොළ දවසට එතන තියෙන තදබදය අඩු කරන්න. පොළ දවසට හන්දියට වැඩිය අමාරුයි මෙතන. එතනදී අපි ආදර්ශයක් විදියට පෙන්වන්න මාර්ග සංවර්ධන අධිකාරියෙන් අහලා ඒගොල්ලෝ කලේගාන හන්දියේ ඉදන් පුළුල් කරන ප්‍රමාණය අපි තියන්නම් කියලා තාප්පය ඉදිකරන්න තමයි වුවමනා වුනේ. කලේගාන හන්දියේ ඔය දේ නොකරත් මෙතන අඩු ගානේ වාහන දෙකක් තියාගෙන මාරු වෙන්න පුළුවන්. අතන දෙනකම් ඉන්නවා කියලා මෙතන වාහන 02 ක් මාරු වෙන්න බෑ නම් ඒකෙන් වැඩක් නැනේ ඒක තුල කරේ.

ප්‍රධාන අමාත්‍යතුමා කිවුවා මෙතනට ආපු වෙලාවේ ඇස්තමේන්තුවක් සකස් කරලා දෙන්න එතුමා මුදල් දෙන්නම් කියලා. මම බලන්නේ මේ වෙලාවේ පළාත් සභාව විසුරුවන්න කලින් අපිට මුදල් ලබා ගන්න. ඒ මන්ත්‍රීතුමා කියපු විදියටත් සභාව විදියට පෞඪත්වයක් තියෙන්න ඕනෙ බෝපෙ පෝද්දල කිවුවම. ඒ ආකාරයට සකස් කිරීමක් තමයි බලාපොරොත්තු වෙන්නේ. නිකන් සාමාන්‍ය තාප්පයක් නෙමෙයි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගරු උපසභාපතිතුමා නැති නිසා ඒ යෝජනා මම ඉදිරිපත් කරන්නම්.

02. කපුහෙම්පල මාතෘසායන ගොඩනැගිල්ලට අනතුරුදායක හා අවහිර වී ඇති අඹ ගස කැපීමට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. කපුහෙම්පල මාතෘසායන ගොඩනැගිල්ලට ඉහලින් ආසන්න නිවසට විදුලිය සපයන ලද විදුලි රැහැන ඉවත් කිරීමට යෝජනා කරන අතර ගොඩනැගිල්ලේ ඉහල මහලේ ඉදිකිරීම් වලට මෙම රැහැන බාධාවක් බැවින් එම සම්බන්ධතාවය ආසන්න යන අතිත් විදුලි කණුවට සවිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සභාපතිතුමනි, ඉහල මහල ඉදිකිරීමට පෙර පහල මහල පරීක්ෂා කරාද?. බිත්තිය පුපුරලා තිබුනේ. ඒකෙ තවත් ගොඩනැගිල්ලක් ඉදිකරන්න සුදුසුද කියලා පරීක්ෂා කරලා බලන එක තමයි හොඳ. දැනට වැඩ කොටසක් කරනවා නම් ඒක ප්‍රාදේශීය සභාවෙන්ද ඒක කරන්න ඕන.
**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** පහල මහලේ මොකද්ද එතකොට කරන්නේ?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කෙරෙන වැඩ ගැන මම ලිපිගොනුව ගෙන්නවලා තව ටිකකින් බලලා කියන්නම්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** දැනට කම්කරුවන් වගයක් වැඩ කරනවා කියලා මට දැනගන්න ලැබුණා. එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. බෝපෙ පෝද්දල ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා තුමියන්ලාගේ මාසික ඉන්ධන දීමනාව රු. 8,000.00 ක් කිරීමටත් දුරකථන දීමනාව රු.5,000.00 කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ යෝජනාව එතුමා සද්භාවයෙන් ඉදිරිපත් කරන්න ඇති. ප්‍රශ්නය තියෙන්නේ අපි මහජන බදු මුදල් වලින් නඩත්තු වන ආයතනයක්. අපි ගරු සේවයක් කරන්න මෙතනට අපි ඉදිරිපත් වෙලා තියෙන්නේ. ඒ හින්දා ඒ ගෞරවය රැකෙන පරිදි අපේ පැත්තෙන් මැදිහත් වීම කරානම් හොඳයි. අපි අපේ කැප කිරීම් කරන්න ඕන. මේ යෝජනාවට අපි තරයේ විරුද්ධ වෙනවා. මේ යෝජනාවට අපි ප්‍රතිපත්තියක් විදියට විරුද්ධයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපි සියලුදෙනාම පළාත් පාලන මන්ත්‍රීවරු. මහජන නියෝජිතයන්. මහනගර සභාවෙත් ඉන්නේ පළාත් පාලන මන්ත්‍රීවරු. නගර සභාවෙත් ඉන්නේ පළාත් පාලන මන්ත්‍රීවරු. ප්‍රාදේශීය සභාවෙත් ඉන්නේ පළාත් පාලන මන්ත්‍රීවරු. එතකොට මහනගර සභාවේ මන්ත්‍රීවරුන්ගේ දුරකථන දීමනාව රු. 5,000.00 යි. ඉන්ධන දීමනාව රු.8,000.00 යි. ඒක නිසා සාධාරණයක් තියෙන්න ඕන. අපි මහජන නියෝජිතයෝ අපිටත් වියදම් තියෙනවා. මිනිස්සු අපි ගාවට වැඩ කරගන්න එනවා. දවසකට රු. 250.00 ක විතර පෙට්‍රල් ගහන්න ඕන. ඒ නිසා මේ යෝජනාව සම්බන්ධව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරලා සාධාරණයක් ඉෂ්ඨ කරන්න. අපි මේක මහඇමතිතුමාට යොමු කරලා මහඇමතිතුමාගේ අනුමැතිය ගමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි පොඩි ප්‍රාදේශීය සභාවක්. එතකොට අපි බදු මුදල් වලින් නඩත්තු වෙන්නේ. ඒ නිසා නඩත්තු වියදම් පුළුවන් තරම් අවම කරන්න ඕන. ඒ නිසා මම මේ යෝජනාව තරයේ ප්‍රතික්ෂේප කරනවා. එතුමා මේ යෝජනාව සද්භාවයෙන් කරන්න ඇති.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපිත් සද්භාවයෙන් කියන්නේ. අපි මේකට විරුද්ධ නැ. මේක අපිට ගෙවන්න පුළුවන් නම් මේක අපි අනුමත කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** බෙදීමක් ඉල්ලනවා අපි විරුද්ධයි.

(සභාව සෝෂාකාරි විය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ තුන්දාහෙ, දාහෙ යෝජනාව ආවම ජේ.වී.පී. එක විරුද්ධ වුනා. දැන් ගන්නේ නැද්ද?.

(සභාව සෝෂාකාරි විය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපිට සාමාන්‍යයෙන් දුරකථන දීමනාව රු. 1,000.00 ක් දෙනවා. මම ඕන නම් දුරකථන බිල ගෙනල්ලා පෙන්නන්නම් ඒක රු.6,000.00 ක් රු.7,000.00 ක් වෙනවා මාසෙකට.

(සභාව ඝෝෂාකාරි විය)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** රජයේ සේවකයන්ගේ වැටුප ජීවන වියදම අනුව වැඩිවුනාට තාම මන්ත්‍රීවරුන්ගේ වැඩිවෙන්නේ නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම මේ ඉල්ලීම පිළිබඳ මගේ මතය ප්‍රකාශ කරනවා. මේ මාතෘකාව අපි කණ්ඩායමක් විදියට සාකච්ඡා කරමු. මමත් අනුමත කරන කාරණය තමයි මන්ත්‍රීවරු බොහොම අමාරුවෙන් ඉන්නේ. දීමනාව අඩුයි. පළාත් සභාව, පාර්ලිමේන්තුව ගත්තම ප්‍රාදේශීය සභාව තමයි වැඩිපුරම කාර්යයක් ඉෂ්ට කරන්නේ. මල ගෙවල්, මඟුල් ගෙවල්, දාන ගෙවල් සියල්ලටම යන්නේ මේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමාලා. වියදම් වෙන්නේ මෙතුමන්ලගෙන්. නමුත් වර්තමාන තත්වය සලකලා බලලා මේ යෝජනාව කල් තියමු. වැරදි මතයක් යාවි නැත්නම්.

(සභාව ඝෝෂාකාරි විය)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි දන්නවා අපි පත්වන අපහසුතාවයන්. මල ගෙදර යන්න ඕන, මඟුල් ගෙදර යන්න ඕන, දාන ගෙදර යන්න ඕන. මේ හැම එකටම යන්න ඕන බයිසිකලෙන්. මන්ත්‍රීවරු විදියට අපිට විශාල වගකීමක් තියෙනවා. අපිට දීමනාව හම්බෙන්නේ රු. 15,000.00 යි. ඒත් ඊට වඩා සේවයක් අපෙන් සිද්ධ වෙනවා. ඒක පැහැදිලිවම කියන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සුගත් මන්ත්‍රීතුමා අපි මෙහෙම කරමු. මේකට අපිට චෝදනාවක් ගන්න බෑ. හෙට මාධ්‍ය වල යාවි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු එකතුවෙලා තීන්දුවක් ගත්තයි කියලා දීමනා වැඩි කරන්න.

(සභාව ඝෝෂාකාරි විය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ සම්බන්ධව මන්ත්‍රීවරු අපහසුතාවයට පත්කරන්න මම කටයුතු කරන්නේ නෑ. අද තීන්දුවක් ගන්නේ නෑ. යෝජනාව ගෙනාපු උපසභාපතිතුමත් දැන් නෑ. ඊළඟ සභාවට කල් දානවා.

(සභාව ඝෝෂාකාරි විය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා වර්තමාන තත්වය සලකා බලලා මේක මාස කිහිපයක් පරක්කු කරන්න. ජනතාවට විශාල සේවයක් කරන්න තියෙනවා. ඒක තුල මේ යෝජනාව මාස කිහිපයක් ප්‍රමාද කරලා යෝජනා කරන්න. සංවර්ධන වැඩ කටයුතු ඉදිරියට කරගැනීම ප්‍රමුඛතාවය වෙන්න ඕන අපේ. මම සියලු මන්ත්‍රීවරුන්ට කියනවා මේක තව මාස කිහිපයක් ප්‍රමාද කරලා ගේන්න කියලා. මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකමක් තමයි ඉල්ලීම.

(සභාව ඝෝෂාකාරි විය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට ගෙවන ඉන්ධන දීමනාව හා දුරකථන දීමනාව අවුරුදු දහයකට පහලොවකට කලින් ගෙනාපු එකක්. පළාත් සභාවේ, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට අපි විශාල මුදලක් වියදම් කරනවා. මේක නිකන් දෙන්නේ නෑ. දුරකථන බිලයි, ඉන්ධන බිලයි අරගෙන දෙන්නේ.

මම විරුද්ධ වෙන කාරණාවකුත් තියෙනවා. මේ වෙලාවේ මන්ත්‍රීවරු 22 ක් ඉන්නවා. මේ මුදල සභාවක් විදියට ගත්තම අපිට දරන්න බෑ. ඒ සියලු දේට වැඩිය මහජනතාව අපිට බලය දුන්නේ මිනිස්සුන්ට සේවයක් කරන්න. මේ සියලු දෙනා ඇවිල්ලා තියෙන්නේ මේ දීමනාව මෙච්චරයි කියලා දැනගෙන. එතනදී මම ඉල්ලීමක් කරනවා සභාපතිවරයා විදියට අපේ සභාව තවදුරටත් ශක්තිමත් වුනාම ඉදිරියේදී මහජනතාව වෙනුවෙන් වැඩියෙන් සේවයක් කරලා ඊටපස්සේ මේක ගැන සලකා බලන්න.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මන්ත්‍රීවරු 11 ක් ඉදපු එක 22 ක් වුනාට පස්සේ මහජනයාට කරන්න තියෙන සේවයට අවහිරයක් වෙනවා කියලනේ කියන්නේ. එතකොට හිටිහැටියෙම මේක ආවේ. සභාව පටන් අරන් අවුරුද්දක් වෙනවා ලබන මාසෙට. පෙබරවාරි මාසෙ මැතිවරණය තියලා මාර්තු මාසෙ සභාව පිහිටුවනවා. අවුරුද්දක් යනකොට එනවා දීමනාව වැඩි කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔයි එක මන්ත්‍රීවරයෙක්ගේ ඉල්ලීමක්. මේ මන්ත්‍රීවරු කවුරුවත් හොරකම් කරන්නේ නෑ. සාධාරණව මනුස්සයකුට ජීවත්වෙන්න පුළුවන් දීමනාවක් තියෙන්න ඕන.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අපිට අනිත් මන්ත්‍රීවරුන්ගේ සද්භාවය බලාගන්නත් එක්ක බෙදීමක් දෙන්න.

(සභාව සෝෂාකාරි විය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාපතිවරයා විදියට මට තියෙන බලතල අනුව මේ යෝජනාව මම මාස කිහිපයකට කල් තියෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඔබතුමා මේක ගෙවන වෙලාවට ගෙවන්න. මාස තුනකින් බැරිනම් අවුරුද්දකින් ගෙවන්න. දැන් මෙතුමලගේ අභියෝගයට බෙදීමක් දෙන්න.

(සභාව සෝෂාකාරි විය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඒ යෝජනාව කල් තියනවා. ඒ යෝජනාව ගෙනාපු උපසභාපතිතුමා ඇත්තෙත් නෑ. ඒක මම කල් තියෙනවා ඒ යෝජනාව අද ක්‍රියාත්මක වෙන්නේ නෑ. ප්‍රදේශයේ සංවර්ධනයට අදාල යෝජනාවක් නෙමෙයි. ඒක මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද පිළිබඳ යෝජනාවක්. ඒ හින්දා එතුමත් එක්ක සාකච්ඡා කරන්නත් එතුමා නෑ මෙතන. මට ඒ පිළිබඳ තීරණයක් ගන්න බෑ. බෙදීමකට යන්නේ නෑ. යෝජනාව කල් තියෙනවා.

(සභාව සෝෂාකාරි විය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක දැන් ක්‍රියාත්මක වෙන්නේ නෑ. මේක ක්‍රියාත්මක කිරීම නවත්තනවා. මේක ඉදිරිපත් කරපු උපසභාපතිතුමත් නෑ. පුද්ගලිකව මට මේ සම්බන්ධව ගැටලු තියෙනවා.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සභාපතිතුමා, මේ යෝජනාව දැන් කල් තිබ්බා නම්, උපසභාපතිතුමා දැන් නැත්නම් ඉතිරි යෝජනා වලට යන්න. කාලය හරි වැදගත්. එකම තැන යන එක විතරයි දැන් වෙන්නේ.

(සභාව සෝෂාකාරි විය)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දැන් ඇත්තටම මන්ත්‍රීවරු ප්‍රමාණය වැඩිවුන එකට අපිත් විරුද්ධයි. හැබැයි මම යෝජනාවක් ගේනවා. අපේ අනිල් මන්ත්‍රීතුමා යෝජනා කරා මන්ත්‍රීවරු 22 ක් වුනා කියලා මේ ක්‍රමය යටතේ. ඉතින් මම යෝජනාවක් ගේනවා පහුගිය මැතිවරණ ක්‍රමයට ගිහින් කොට්ඨාශ ක්‍රමය ඉවත් කරලා අනුපාත ක්‍රමයට මැතිවරණය තියන්න කියලා මම යෝජනාවක් ගේනවා මන්ත්‍රීවරු 11 ක් වන විදියට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

(සභාව සෝෂාකාරි විය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විධිමත් යෝජනාවක් ඊළඟ සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමන්ලා හැම තිස්සෙම බනින්නේ මටනේ. මම දැන් ශබ්දයක් නැතිව හිටියනේ.

(සභාව සෝෂාකාරි විය)

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම එක දේකට එකඟ නෑ. ඔබතුමා කල් තියන්නේ උපසභාපතිතුමා නැති නිසා. එහෙම නම් එකක් තියෙනවා අනිල් මන්ත්‍රීතුමා නැතිව පත්කරන්න බෑ. දැන් ඒක අමතක කරලා දාන්න. හැබැයි අමතක කරන්න එපා මහා ශ්‍රේෂ්ඨ නායකයා ජේසුස් වහන්සේ ගොන්ගොතල් කන්ද නැග්ගේ කුරුස කර ගහගෙන තනියම අපේ ගරු සභාපතිතුමා අපි සියලු දෙනා වෙනුවෙන් ගොන්ගොතල් කන්ද නැග්ගා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි ඒකට නම්. ස්තුතියක් කිරීම පිළිබඳ.
අබේසේකර මන්ත්‍රීතුමන්ගෙන් ස්තුතියක් ඇහුවමයි.

(සභාව ඝෝෂාකාරි විය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-**

05. තොටගොඩ අඹගහවත්ත හේනවත්ත මාර්ගයේ අවසාන කොටසේ දෙපස පැති බැම්ම ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

අනිල් බන්දුතිලක මන්ත්‍රීතුමා ඉස්සෙල්ලා අහපු ප්‍රශ්නෙට මම දැන් උත්තරයක් දෙන්නම්. අර කපුහෙම්පල සෞඛ්‍ය මධ්‍යස්ථානය ගැන. ඒක දිස්ත්‍රික් ඉංජිනේරුතුමා පරීක්ෂා කරලා බලලා තමයි නිර්දේශ ලබා දුන්නේ. තීන්ත ආලේප කිරීම ගොඩනැගිල්ල ඉදිරිපිට කැටගල් ඇල්ලීම ඒවා තමයි බිම් මහලේ අළුත්වැඩියා කටයුතු සඳහා තියෙන්නේ. ඊටපස්සේ පළමු මහලේ වහල සෑදීම ගඩොල් බැම්ම අඩි 03 ක් වටේට යෙදීම ඒ ටික තමයි ක්‍රියාත්මක කරන්න තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-**

06. තොටගොඩ මහවත්ත හරස් මාර්ගය, මාර්ගය පිහිටි ආකාරයටම සංවර්ධනය කිරීමට යෝජනා කරමි. (කොන්ක්‍රීට් අතුරා)

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. තොටගොඩ අඹගහවත්ත හේනවත්ත මාර්ගය දෙපස කොරිපස් හෝ පස් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. පලිවතුගොඩ ප්‍රීම්රෝස් පාක් මාර්ගයේ තාරදමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමාගේ යෝජනා**

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-**

09. හිරිඹුර ගැමුණු මාවත ගුණසේකර මහතාගේ නිවස ඉදිරිපිට ගිලා බැස ඇති සිලින්ඩර වෙනුවට නව සිලින්ඩර යොදා දෙපස කාණු පිලිසකර කිරීමට යෝජනා කරමි.

මේ අවස්ථාවේ මම මාර්ග සංවර්ධන අධිකාරියට විශේෂ ස්තුතියක් පිරිනමන්න කැමතියි. හිරිඹුර සුළු වර්ෂාවකදී පවා කාණු උතුරලා යට වෙනවා. නව සිලින්ඩර යොදලා ඒක කාණු පිලිසකර කරලා දුන්නා. ඒකට විශේෂ ස්තුතිය පිරිනමනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-**

10. කරාපිටිය පන්විලදූවවත්තේ දීර්ඝ කාලීන ගැටලුවක්ව පවතින වැසි ජලය බැස යාමේ ගැටලුව නිරාකරණය කිරීමට ගත් තීරණය ක්‍රියාත්මක කිරීමට මම යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ යෝජනාවට මොකද වුනේ කියලා පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට පළාත් පාලන ඉංජිනේරුතුමාගේ නිර්දේශ ඉල්ලලා ලිපියක් යවන්න තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අනුමැතිය ගත්තද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකද්ද කරන්නෙ කියලා අහන්න තියෙන්නේ. මම ඒ ස්ථානයට දෙපාරක් ගියා. ඒක විසඳන්න බැරි වුනා. අත්පත් කර ගැනීම් වලට යන්න වේවි. පළාත් පාලනයෙන් නිර්දේශ ගන්න තීරණය කරා ඊටපස්සේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-**

11. ගොඩකන්ද ගල්කැටියවත්ත මාර්ගයේ සිට රණවිරු ප්‍රියංකර මාවත දක්වා ජලය ලබා ගැනීමට පළුදුකල ස්ථාන පිලිසකර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-**

12. ගොඩකන්ද සේවාපියස භූමියේ ඔසුපැල සිටුවා සංරක්ෂණය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-**

13. ගොඩකන්ද සිට හෝළුවාගොඩ මහ ඇල දක්වා සම්බන්ධවන හීන් ඇල ජලය බැස යන ආකාරයට පිලිසකර කිරීමට අදාල ආයතනයන් දැනුවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒක කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවට අයිති. ඒක ඉල්ලීමක් කරලා යවන්න තමයි මම යෝජනා කරේ.

14. ගොඩකන්ද මාර්ගය හරහා වැඩි සැර විදුලි රැහැන් පද්ධතියක් ඇදීමට කටයුතු සූදානම් වීමත් සමඟ ප්‍රදේශයේ ජනතාවට එමගින් සිදුවන පාරිසරික හානිය හා ජනජීවිතයට සිදුවන බලපෑම හේතුවෙන් එම විදුලි රැහැන් පොළොව යටින් ඇදීමට ක්‍රියාත්මක වීමට ආසන්නව තිබියදී කුමන හෝ බලවේගයක් ක්‍රියාත්මකව ඇති බලපෑම හේතුවෙන් එය නැවත ක්‍රියාත්මක වන බැවින් ජනජීවිතයට සිදුවන බලපෑම හා පාරිසරික විනාශය අවම වන පරිදි භූගතව රැහැන් ඇදීම නැවත ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලීම.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම රැහැන් භූගතව එලන්න කියලා සම්බන්ධීකරණ කමිටුවටත් යෝජනා කරා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේක නාගරික සංවර්ධන අධිකාරිය සැලැස්ම ඉදිරිපත් කරපු අවස්ථාවෙත් කතා කරා. ඊටපස්සෙත් කණු දිගටම තිබ්බා. ඒක හින්දා මේකට කඩිනම් විසඳුමක් ගන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මොහොතකට කලින් ගෙනාවා විදුලි රැහැන් අයින් කරන්න කියලා ඉතාම පැහැදිලිව දැන් කවදාහරි දවසක මේවත් අනතුරුයි කියලා මේවත් අයින් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ලියුමක් සකස් කරලා දාමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එයාලා මේකට තීන්දුවක් නොදුන්නොත් අපි ගිහින් විරෝධය පල කරමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මාර්ගය අයිති දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට. වාහන දෙකක් මාරුවෙන්න බැරි වන තරමට කණු ඉන්දලා තියෙනවා. එහෙටත් සභා යෝජනාව යවන්න. ඒවගේම විදුලි බල මණ්ඩලයටත් ඒ යෝජනාව යවන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඉදිරි කාලයේදී මාර්ගය මංතීරු දෙකකට හදන්න යනවා. ඒ නිසා දැන්ම ක්‍රියාත්මක වුනොත් හරි.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** සුභ අලුත් අවුරුද්දක් වේවා සියලු දෙනාටම. ක්‍රෝධය, වෛරය, මාන්නය නැතිව සභාවේ සියලු නීතිරීති වලට ගරු කරමින් මහජනතාවට සේවය කරන්න ශක්තිය ධෛර්ය ලැබේවා ප්‍රාර්ථනා කරමි.

15. හපුගල පොදු සුසාන භූමියේ හදිසි අවස්ථාවන් සඳහා භාවිතයට ගැනීමට ඇති ගොඩනැගිල්ල සඳහා විදුලිය ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(සභාව පැහැදිලි නොවීය)

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය)

**<u>(ඊ) කාරක සභාවල වාර්තා</u>**

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කාරක සභා සඳහා මේ වර්ෂයට සභිකයින් පත්කර ගත්තා. එතකොට අපි පළමු වතාවට මේ අවුරුද්දේ කමිටු රැස්වුනා. මම ඒ කමිටුවේදී දැක්ක කාරණයක් නිවැරදි කර ගන්න ඕන. කමිටුවට ඉදිරිපත් කරන ගෙවීම් වවුචර් සම්බන්ධයෙන් ඒවාට අදාල ගොනු සමග ඉදිරිපත් කරනවා නම් හොඳයි. මොකද සමහර ඒවාගේ එතනට එන්නේ ගෙවීම් වවුචරය විතරයි. සමහර ගෙවීම් කරන්න අධ්‍යයනයක් කරන්න ඕන. ඒවා කල් ඇතිව දෙන්නේ නැනේ කාරක සභාවට ඉදිරිපත් කරන කොට. පුනරාවර්තන ගෙවීම් නෙමෙයි. ඒවා ප්‍රශ්නයක් නෑ. වවුචර් ගොනු සමග කමිටුවට ඉදිරිපත් කරනවා නම් හොඳයි. එහෙම නැත්නම් කමිටුවේ සාකච්ඡා කරන කරුණු කල් ඇතිව දැනුම් දෙන්න. එතකොට අපිට කල් ඇතිව ඇවිත් ඒවා බලන්න පුළුවන්. අපි අත්සන් කරන්න විතරක් එතනට කැඳවන එක සාධාරණ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවශ්‍ය දේවල් ඉදිරිපත් කරන්න පුළුවන්. ඒක ඔබතුමාලගේ අයිතියක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ නිසා අපිට ඒවා ඒ මොහොතේ ඉදිරිපත් කරන්න. එදා ඒවා මට බලාගන්න බැරිවුනා. අපි ඇවිල්ලා අනුමත කරන ඒවගේ අත්සන් නොකර යනවා නම් ඒක ප්‍රශ්නයක්නේ. ඒ නිසා ඒකට ක්‍රමවේදයක් සකස් කරන්න.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි ඒ කමිටුවලට සම්බන්ධ නෑ. ඒ නිසා අපි විරුද්ධයි කියන එක සඳහන් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා අදහස් කරන්නේ බෙදීමකට ගිහින් ඡන්ද විමසීමකට යන්නද ?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වාර්තාවේ අපි විරුද්ධයි කියලා සඳහන් වුනානම් ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් බෙදීමකට යන්න වෙනවා.

(සභාව පැහැදිලි නොවීය)

<u>01. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව</u>

**I. 2018.12.21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාඃ-** 2018-12-21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන් පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 11
විපක්ෂව - 5
ඡන්දය දීමෙන් වැළකී සිටි - 03
සභා ගර්භයේ රැඳී නොසිටි - 03

**2018-12-21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
03. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
06. ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
07. ගරු මන්ත්‍රිනී ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
10. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
11. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා

**2018-12-21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
03. ගරු මන්ත්‍රිනී ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
04. ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
05. ගරු මන්ත්‍රිනී ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**2018-12-21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2018-12-21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය විමසීමේදී සභා ගර්භයේ රැඳී නොසිටි පිරිස**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාඃ-**2018-12-21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද 6කින් සභා සම්මත විය.

**II. 2018.12.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාඃ-** 2018-12-28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන් පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 11
විපක්ෂව - 5
ඡන්දය දීමෙන් වැළකී සිටි - 03
සභා ගර්භයේ රැඳී නොසිටි - 03

**2018-12-28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
03. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද  මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
06. ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
07. ගරු මන්ත්‍රිනී ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
10. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
11. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා

**2018-12-28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
03. ගරු මන්ත්‍රිනී පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
04. ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
05. ගරු මන්ත්‍රිනී ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**2018-12-28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2018-12-28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය විමසීමේදී සභා ගර්භයේ රැඳී නොසිටි පිරිස**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාඃ-**2018-12-28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද 6කින් සභා සම්මත විය.

**III. 2018.12.28 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.**

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එකේ සවුත්ලන්ඩ් විද්‍යාලයේ විනෝද බදු මුදල නිදහස් කරලා තියෙනවා. ඒක අයකරගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හේතුව ?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒක කොට්ඨාශයේ පාසලක් නෙමෙයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අදාල සුදුසුකම් සම්පූර්ණ කරලා, විදුහල්පතිත් සහතික කරලා තියේ නම් නිදහස් කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එකේ දාලා තියෙන නිසා තමයි සවුත්ලන්ඩ් විද්‍යාලයේ නම සඳහන් කරේ. පොදුවේ විනෝද බදු නිදහස් කිරීමට මම විරුද්ධයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අදාල සුදුසුකම් මේ වනවිට සම්පූර්ණ කරලා තියේනම් නිදහස් කරන්න වෙනවා. ඉදිරියේදී කරන ඒවට අපි සභා තීන්දුවක් ගමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගිය සභාවෙත් කිව්වේ ඒක. මේ සභාවේ ගන්න තීන්දුවක්. කොට්ඨාශයේ, බලප්‍රදේශයේ පාසලක් නම් නිදහස් කරාට කමක් නෑ.

**ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, එදා ඒ කමිටුවේදී ඕක ආවම මටත් අවසන් වතාවට නිදහස් කරන්නේ කියලා අපි ඒකට අනුමැතිය දුන්නා. මේ සභාවේදී තීන්දුවක් ගමු කියලා කතා වුනා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කලින් කමිටුවට දාලා ගෙවපු එකේ වාර්තාවක් මෙතනට එන්නේ. ඒකට විරුද්ධයි කියලා කියන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** නෑ. ඒකට නෙමෙයි කිව්වේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සවුත්ලන්ඩ් කතාවක් කිව්වේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේකට දාලා තියෙන නිසා කිවුවේ තීන්දුවක් ගන්න ඒකට. ගිය සභාවෙත් ගත්තේ නෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමන්ලා කිව්ව විදියට යෝජනාවක් ආවේ නෑනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ගේන්න යෝජනාව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. මම ගේන්නේ නෑ. ඔබතුමාලා ගේන්න යෝජනාව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමාට විශේෂ බලතල තියෙනවා යෝජනා ගේන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ගේන්න. ඔබතුමා හැරනකොට මම දන්නවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ගේනවා යෝජනාව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊළඟ සභාවේ න්‍යාය පත්‍රයෙන් ගේන්න. දැනට දැනුවත් කරගෙන යනවා. ගහෙන් ගෙඩි එන්න වගේ බෑනේ. අවුරුදු ගාණක් තිබුනා. ඒක බැරියර් එකක් දාලා නවත්තන්න බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කවුද දැනුවත් කරන්නේ?. ඉස්කෝලේ දැනුවත් කරනවද? මෙහෙම කරනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉල්ලීම් කරන්න එනවනේ. ඒ අයව දැනුවත් කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ලියුමක් යවන්න සභාවේ තීන්දුවක් අරගෙන.

( සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයාලා බුක් කරනකොට ලියුමක් ඕනනේ. එක් ගන්න ආවම කාරණය කියනවා. ගෙවන්නේ නෑ කියලා. සභා තීරණයක් ගන්න වෙනවා. ඒක මේ වෙලාවේ ගන්න බෑ. ඒක තේරුම් ගන්න. ඔබතුමාලා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ඕක වරදවා තේරුම් ගන්න එපා. ඒක මම දැන් ගේන්න හැදුවේ ඔබතුමා ගේන්න කියපු නිසා. නැත්නම් ඔබතුමා ගෙනාවත් අපි පක්ෂ වෙනවා. අපිට ගහගන්න දෙයක් නෑ මේකේ. සභාපතිගේ යෝජනා කියලා දාන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** සභාපතිතුමනි, ගැටුමකට යන්න ඕන නෑ. අපි ඊළඟ න්‍යාය පත්‍රයට දාමු යෝජනාව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමාගේ එකක් විදියට දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. මේකේ මේ අවුරුදු 15 ක් විතර. මේක නිදහස් කරලා තියෙනවා. එකපාරට සභාපති වුන ගමන් මට බෑ ඒක නවත්තන්න. මමත් ගාල්ලේ ප්‍රධාන පෙලේ විද්‍යාලයකට ගියපු කෙනෙක්. එන්නේ ඒ විද්‍යාල වලින්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා ගිය ඉස්කෝල වලින් එන්නේ කොච්චර කාලයකට පස්සෙද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සාකච්ඡා කරන්න හරි යෝජනාවක් දාන්න ඕනනේ. මොකක්හරි යෝජනාවක් දාන්න ඕන.

( සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විදුහල්පතිතුමා ලියුමක් දෙනකොට මේ සියලුම මුදල් විද්‍යාලයීය කටයුතු වලට බැර වෙනවා කියලා, සභාවක් විදියට විද්‍යාලයට උදවු කරන්න බැරි නම් ඒකේ ගැටලුවක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක සම්පූර්ණයෙන් නිදහස් කරලා දාන්න එතකොට ඉවරයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොදු ක්‍රමවේදයකට තමයි ගිහින් තියෙන්නේ. පොදු ක්‍රමයෙන් සියලු මුදල් නිදහස් කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පොදු ක්‍රමවේදය නෙමෙයි. මේක හදාගත්ත එකක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වෙනස් කරන්න ඕනනම්. සභා තීන්දුවක් ගන්න. විධිමත් සභා තීන්දුවක් ගමු. කමිටු වාර්තාවල් යන අතරේ මේකේ ගේන්න එපා. පොදුවේ ගේන්න. මින් ඉදිරියට විනෝද බදු මුදල නිදහස් කරන එක නවත්තන්න. ඊටපස්සේ අපි බලමු ප්‍රශ්නයක් විදියට නවත්තනවද?. සම්පූර්ණ මුදල අපි ගන්නවද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාඃ-** 2019-01-08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡේදීමකට යනවා.

ඉන් පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 11
විපක්ෂව - 5
ඡන්දය දීමෙන් වැළකී සිටි - 03
සභා ගර්භයේ රැඳී නොසිටි - 03

**2019-01-08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
06. ගරු මන්ත්‍රිනී ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
07. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
09. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
11. ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා

**2019-01-08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
03. ගරු මන්ත්‍රිනී පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
04. ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
05. ගරු මන්ත්‍රිනී ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**2019-01-08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
02. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
03. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2019-01-08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය විමසීමේදී සභා ගර්භයේ රැඳී නොසිටි පිරිස**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා:-**2019-01-08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද 6කින් සභා සම්මත විය.

**<u>02. කර්මාන්ත හා සේවා කමිටුව</u>**

**I. 2018.12.26 දින පැවති කර්මාන්ත හා සේවා කමිටු වාර්තාව.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා:-** 2018-12-26 දින පැවති කර්මාන්ත හා කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන් පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 11
විපක්ෂව - 5
ඡන්දය දීමෙන් වැළකී සිටි - 03
සභා ගර්භයේ රැඳී නොසිටි - 03

**2018-12-26 දින පැවති කර්මාන්ත හා සේවා කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
03. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
06. ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
07. ගරු මන්ත්‍රිනී ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
10. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
11. ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා

**2018-12-26 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
03. ගරු මන්ත්‍රිනී පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
04. ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
05. ගරු මන්ත්‍රිනී ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**2018-12-26 දින පැවති කර්මාන්ත හා කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
02. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා
03. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා

**2018-12-26 දින පැවති කර්මාන්ත හා සේවා කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය විමසීමේදී සභා ගර්භයේ රැඳී නොසිටි පිරිස**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාඃ**-2018-12-26 දින පැවති කර්මාන්ත හා සේවා කමිටු වාර්තාව වැඩි ඡන්ද 6කින් සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව** - නැත

**04. පරිසර කමිටුව** - නැත

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛණ ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා:-** 2018 වර්ෂයේ දෙසැම්බර් මස මාසික ලැබීම් විශ්ලේෂණය (ප්‍රා.ස. 06)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා:-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා:-** 2018 වර්ෂයේ දෙසැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස. 14)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා:-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා:-** 2018 වර්ෂයේ නොවැම්බර් මස හා දෙසැම්බර් මස සංසන්ධනාත්මක මාසික ලැබීම් විශ්ලේෂණය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා:-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. වෙනත් ලේඛණ.**

**I. ප්‍රගතිය.**

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, මේක ඉතින් ඔබතුමාලටත් අහලා එපා වෙලා. අපිටත් කියලා එපාවෙලා. දැන් මේ සභාවට අපි තවදුරටත් චෝදනා ඉදිරිපත් කරලා වැඩක් නෑ. මොකද අපිට ප්‍රගතියක් දෙන්නේ නෑ. දැන් දිගින් දිගට කියනවා ඔබතුමාට, ගරු සභාපතිතුමනි, මේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් දෙන්න කියලා.

දැන් ඔබතුමා බලන්න, පළමුවෙන් මේ ප්‍රාදේශීය සභාවට දාපු යෝජනා වලට මුකුත් කරාද බලන්න. අනවසර ඉදිකිරීම් පිළිබඳව මොකද්ද කරේ?. අනවසර ගොඩකිරීම් පිළිබඳව මොකද්ද කරන්නේ?. මොනවද ගත්ත පියවර?. ලීඩ්ස් ඉන්ටර්නැෂනල් එකේ තියෙනවා මේ පිළිබඳ මොනවද ගනිපු තීන්දු?. සභාවට ඇත්තටම වුවමනාවක් නැද්ද මේවා ගැන. නැත්නම් කවුරුත් අනවශ්‍යයි කියලා දාලා එහෙම ඉඳිමු. මට තේරෙන්නේ නෑ මොකද්ද කියන්න. ඇයි මේවා ගැන ඔබතුමන්ලා උනන්දුවක් නැත්තේ?. මට නම් තේරෙන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අබේසේකර මන්ත්‍රීතුමා අපි ලීඩ්ස් තාප්පෙට නඩු දාන්න භාරදීලා තියෙන්නේ. ගොඩනැගිල්ල සම්බන්ධ භූ විද්‍යා හා පතල් කාර්යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය, අදාල ආයතන ගෙනල්ලා චාර්ටඩ් ඉංජිනියර්කෙනෙකුත් ආවා. ඒ සියලු දෙනා ඇවිත් කතා කරලා තීන්දුවක් ගත්තා. NBRO එකේ පරීක්ෂණය කරන්න. NBRO එකේ පරීක්ෂණාගාර වල ඒ පරීක්ෂණය කරන්න අපි එකගතාවයට ආවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** ඒ වගේ දෙයක් කරද්දී හැමදාම මේවා වෙනුවෙන් කතා කරපු අපි වගේ අයට එන්න කියනවා නම් ඒක වටිනවා. මම නෙමෙයි. මේ සභාව දිගින් දිගට ඉදිරිපත් කරන ඒ අය කැඳවනවා නම් ඒක වටිනවා.

- ඊළඟට, සභාපතිතුමා කුළුණ පිළිබඳව ඒක ආවා හෝස් ගාලා ඊටපස්සේ මුකුත් නෑ.

- ඊටපස්සේ හපුගල හන්දියේ තියෙන අනවසර ඉදිකිරීම පිළිබඳව.
- ඊළඟට දහනායක හාඩ්වෙයාර්.

මේවා දිගින් දිගට යන්න ඕන නෑ. මම තව සැරයක් ඕනනම් මේවා ඉදිරිපත් කරන්නම්.

මෙතන දසනායක එක තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දහනායක හාඩ්වෙයාර් පිළිබඳ ඊළඟ සභාවට වාර්තාවක් දාන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟ සභාවේදී දෙන්න. ඒකේ ඉදිකිරීම් දිගටම කරනවා මෙතන දසනායක සර්විස් සෙන්ටර් එක, ඊරියගහ අන්තිම අහිංසක මිනිහා කරපු සර්විස් සෙන්ටර් එක නවත්තනවා පරිසර එකෙන්.

මම කාරක සභාවක් හරි කරලා ඉල්ලනවා ඊරියගහ වෙන්දේසි කරපු ඉඩමේ අලුත්ම තත්වය පිළිබඳ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, කාසල්වත්තේ පැති බැම්මක් ඉදිකරන කොට මම පැමිණිල්ලක් කරා. ඒක බලන්න ගිහින් තිබුණා. කෙසේ නමුත් අද වෙනකම් ලියුමක්වත් ගිහින් නෑ ඒක නවත්තන්න කියලා. ඒකට නඩු දාන්න තීරණය කරා. නමුත් මුකුත් වුනේ නෑ. අද වෙනකොට ඒවා කරලා ඉවරයි. දැන් හෙට අනිද්දා තාප්පෙත් බඳීවි. මම දන්නේ නෑ මොනවද වෙන්නේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියනකොටම මමත් ගිහින් බැලුවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** පසු විපරමක් හරි කරලා බලන්න ඕන. ඒ කාරණයට අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.

උප කාර්යාලයේ ප්‍රිමික්ස් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය තාර, ගල්, වැලි ගෙනල්ලා තියෙනවා. ඒවා මුදල් දීලා ගෙනල්ලා තියෙන්නේ ගොඩගහලා තියන්න නෙමෙයි. කාලය ටික ටික ඇදී යනවා. අපි බද්දට හරි රෝලක් ගෙනත් ඒ වැඩේ කරමු කියලා යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රෝලක් බද්දට ගන්න TO මහත්තයව දැනුවත් කරලා තියෙන්නේ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා, ACCESS ෆිනෑන්ස් ඉඩමේ කන්ද උඩ හදපු ගේ පිළිබඳව ගනිපු තීන්දු මොනවද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාසල්හිල් පෙදෙස තාප්පය හදපු එකට සැලසුම් කමිටුව හරහා නඩු දාන්න ඉන්නේ චනක මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි අයවැයට විරුද්ධ වුනා ඒක ඇත්ත. අපේ යම් ප්‍රතිපත්තිමය කාරණා නිසා ඒකට විරෝධය දැක්වුවත් අයවැය ලේඛණය භාෂා තුනෙන්ම ඉදිරිපත් කරපු එක ඉතාමත්ම හොඳයි. ඒ ගැන මම ස්තුතිවන්ත වෙනවා මුලින්ම.

ඊළඟට අලුත්ම සංඛ්‍යා ලේඛණ ගත්තා නම් හොඳයි. මම හිතනවා ගන්න තිබුන හොඳම සංඛ්‍යා ලේඛණ අරන් කියලා තියෙනවා මේකට. තොරතුරු යාවත්කාලීන වෙන්න ඕන. ඒක වැදගත්.

අපි පහුගිය කාලේ යම්යම් කාරණා වලදී අපි මතු කරපු සභාව ක්‍රියාත්මක වුනේ නැති වුනාම මෙතුමා කතා කරන අනවසර ඉදිකිරීම්, සංවර්ධන ව්‍යාපාති මේවගේ තියෙන අඩුපාඩුකම් ඇති තැන් වලදී මැදිහත්වීම කරන කොට ඒවා නිවැරදිව, නීත්‍යානුකූල තත්වය යටතේ කරන්නේ නැති වුනාම අපි TO මහත්තයට දැනුවත් කරත් ඒවා සාර්ථක වෙන්නේ නැති ප්‍රශ්න තියෙනවා. ඒ කරන මැදිහත්වීම ප්‍රමාණවත් නැද්ද?. ඕවාට මැදිහත් වෙන්න බලතල වල ප්‍රශ්නයක්ද?. TO මහත්තයව දැනුවත් කරලා එයා ඇවිත් බැලුවට පස්සේ ඒවා දිගින් දිගට කරගෙන යනවා. මෙතුමාලාට ගිහින් එතන නතර වෙලා ඉන්න බෑ. වැඩේ ඉවර වෙනකම්. ඒ ගැන පොඩ්ඩක් ඔබතුමා පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනවසර ඉදිකිරීම් සම්බන්ධව මම කාරක සභාවක් කරලා ලේකම්තුමාට කතා කරන්න අවස්ථාවක් ලබා දෙන්න යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම එම යෝජනාව ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී සභා ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් පහත සඳහන් කරුණු පැහැදිලි කරන ලදි.

- ඊරියගහ වෙන්දේසි ඉඩමේ තාප්පය කඩා වැටීම පිළිබඳව හා එය නැවත ගොඩනැගීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික ගොඩනැගිලි පරීක්ෂණ ආයතන හා අප සභාවේ පැවැත්වූ සාකච්ඡාවේ තීරණය සභාව දැනුවත් කරන ලදි.
- අනවසර ඉදිකිරීම් සම්බන්ධ අධිකරණ ක්‍රියාවලියට යන ආකාරය විස්තර කරන ලදි.
- අධිකරණ ක්‍රියාවලියේදී අනවසර ඉදිකිරීම් නඩුවක් අවසන් වීමට ගතවන කාලය පිළිබඳ දැනුවත් කරන ලදි.
- සභාව තුල අනුමත කාර්යය මණ්ඩලය නොමැති බව විස්තර කරන ලදි.

(කාරක සභාව අතරතුරදී ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාට හදිසි, අත්‍යාවශ්‍ය කාරණාවකට සභා ගර්භයෙන් බැහැර වීමට අවශ්‍ය වූ බැවින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් මූලාසනය සඳහා ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා යෝජනා කල අතර, ගරු මන්ත්‍රී තිස්ස මැතිතුමා විසින් එම යෝජනා ස්ථිර කරන ලදි. ඉන්පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා මූලාසනය හොබවන ලදි.)

කාරක සභා අවස්ථාවේ අනවසර ඉදිකිරීම් පිළිබඳ මන්ත්‍රීවරුන්ට ඇති ගැටලු ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා වෙත ඉදිරිපත් කරන ලදි.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයට පැමිණීම සිදුවිය)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීමට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

(සභාව පැහැදිලි නොවීය)

## <u>II. ගෙවීම් අනුමැතියට ඉදිරිපත් කිරීම.</u>

**<u>01. පොදු ගෙවීම් - </u>නැත**

**<u>02. කර්මාන්ත ගෙවීම් - </u>නැත**

**<u>03. සේවක ණය ගෙවීම් - </u>නැත**

## <u>III. ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම.</u>

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-**

01. පහල ගෙදර වත්ත පාර සංවර්ධනය කිරීම - රු. 230,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

02. පහල ගෙදර වත්ත පාර සංවර්ධනය කිරීම අදියර II - රු. 215,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

03. හොරයිසන් වීව් පාර සංවර්ධනය කිරීම අදියර II - රු. 390,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා:-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

04. වටරක නැගෙනහිර කොහොඹන්වත්ත පාර සංවර්ධනය කිරීම - රු. 245,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා:-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

05. කොහොඹන්වත්ත පාර පැති කාණු ඉදිකිරීම. - රු. 115,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා:-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

06. කන්ද උඩ පාර පිවිසුම සංවර්ධනය කිරීම- රු. 210,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා:-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

07. හොරයිසන් වීව් පාර සංවර්ධනය කිරීම අදියර I - රු. 190,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

08. නාගරුක්ඛාරාම පාරේ III වන පටුමඟ සංවර්ධනය කිරීම- රු. 550,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

09. ඉසුරු පෙදෙස පාර අවසාන කොටස සංවර්ධනය කිරීම - රු. 62,500.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

10. VC පාරේ හරස් පාර සංවර්ධනය කිරීම- රු. 110,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

11. වලව්වත්ත II පටුමඟ සංවර්ධනය කිරීම - රු. 230,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

12. වලව්වත්ත I පටුමඟ සංවර්ධනය කිරීම - රු. 230,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

13. ඕපාත හග්ගොඩදූව පාර සංවර්ධනය කිරීම- රු. 280,000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

**IV. මිල ගණන් කැඳවීම** - නැත

**V. ලිපි ඉදිරිපත් කිරීම**

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-**

01. තනුජා සුජීවනී නාගහවත්ත මෙනෙවිය - පෙර පාසල් පාලිකා තනතුරට අන්තර්ග්‍රහණය කරදෙන ලෙස ඉල්ලීම සම්බන්ධව.

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඕකට කලුපටි බැඳගෙන අපිට විරුද්ධව ගියත් කමක්නෑ. ඒක බොහොම සාධාරණ ඉල්ලීමක්. ඒක මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** තනුජා සුජීවනී නාගහවත්ත මෙනෙවිය පෙරපාසල් පාලිකා තනතුරට අන්තර්ග්‍රහණය කරදෙන ලෙස කරන ලද ඉල්ලීම මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.

02. එච්. පී. පී. රේණුකා මිය (බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා පුස්තකාලාධිපති) - පුස්තකාල ඉදිරිපිට මිදුල සකස් කිරීම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒකට මොකද කරන්නේ?.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** කැටගල් තමයි අල්ලන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම ඉල්ලීම මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පුස්තකාල ඉදිරිපිට මිදුල සකස් කිරීම කරන ලද ඉල්ලීම ඒකමතිකව සභා සම්මත විය.

03. එස්. ටී. ජී. ද සිල්වා මයා (බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා ප්‍රජා සංවර්ධන නිලධාරි) -පෙර පාසල් ළමුන් සඳහා නිල ඇඳුම් කට්ටලයක් ලබා දීම.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම ඉල්ලීම මම ස්ථිර කරනවා.

**මූලාසනය හෙබවූ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පෙර පාසල් ළමුන් සඳහා නිල ඇඳුම් කට්ටලය ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම ඒකමතිකව සභා සම්මත විය. ඒක මහ ඇමතිතුමාගේ අනුමැතියට යවන්න ඕන.

සභාපතිතුමා, නැවත සභා ගර්භයට පැමිණි නිසා මූලාසනය නැවත සභාපතිතුමා වෙත ලබාදීමට යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා මූලාසනයට නැවත පැමිණෙන ලදි.

(සභාව පැහැදිලි නොවීය)

**VI. විගණන විමසුම් පිළිබඳ වාර්තා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විගණන විමසුම් වාර්තා සභාගත කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එපා අපිට දෙන්න. ලියන උත්තරය අපිට දෙන්න.

(උෟ). රැස්වීම් කැඳවීම් දක්වා ඇති වෙනත් කාරණා - නැත

**ගරු මන්ත්‍රී බී.කේ. ප්‍රියන්ත මැතිතුමා ඃ-** සභාපතිතුමා, හපුගල පාසල ගාව පාර කොන්ක්‍රීට් කරා. එතන ලොකු අවදානමක් තියෙනවා. ඒකට මොකක්හරි පිළියමක් යොදන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පාර දෙපැත්තට පස් දාන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** සභාපතිතුමා, මම කියන්න ඕන කාරණාව තමයි සංවර්ධන යෝජනා කීපයක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒකේ ගැටලුවකුත් නෑ. මම මෙතන අනවසර ඉදිකිරීම් තියෙන තැන ලක්ෂ 05 ක මුදලක් ලැබිලා තියෙනවා. ඒ ලක්ෂ 05 මුදලින් ඕක කරන්න බෑ. ප්‍රාදේශීය ලේකම්තුමා මට ලිඛිතව දීලා තියෙනවා මේ ආකාරයේ ඉදිකිරීම් නිසා මේක කරන්න බෑ කියලා. ඒ අදාල ලිපිය මම එදා ලේකම් මහත්තයට භාර දුන්නා. ඒ නඩුවට ඒ ලිපිය ඉදිරිපත් කරලා පොදු මාර්ග පද්ධතියක් පිළිසකර කරන්න ඕන නිසා විශේෂ අවස්ථාවක් උසාවියෙන් ගන්න පුළුවන්. ඒකට අවස්ථාවක් එහෙම ඉල්ලුවම දෙනවා. ඒ නිසා මට ඒ අනවසර ඉදිකිරීම ඉවත්කර ගන්න කටයුතු කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒ ඉදිකිරීමට නඩු දාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** අධිකරණයේ ඒ නඩුව යනවා. මේ 31 වෙනිදා නඩුව තියෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමා ඉදිරිපත් කරපු ලිඛිත සාක්ෂියක් තියෙනවා. ඒ අනවසර ඉදිකිරීම නිසා මේ පාර සංවර්ධනය කරන්නවේද කියන කාරණය, ඒ මාර්ගය සංවර්ධනයට අදාල වෙනවා ප්‍රාදේශීය සභාවට.

ප්‍රාදේශීය සභාවට අවාසියක් තමයි ඒ වෙලා තියෙන්නේ. ඒ නිසා ඒක ඉදිරිපත් කරන්න. මේ නිසා මේක කරන්න බෑ. සල්ලිත් ඇවිල්ලා තියෙනවා. ඒ නිසා මට මේකට අනුමැතිය ලබා දෙන්න කියලා අධිකරණයෙන් ඉල්ලන්න පුළුවන්. එතකොට මහජනයා ගැන හිතලා ඒ අවස්ථාව ලබා දෙනවා. මොකද ඒකට අයිතිකාරයෙක් නෑ. අනවසර ඉදිකිරීම කරපු අය උසාවියට යන්නේ නෑ. උසාවියට දෙයක් ඉදිරිපත් කරන්නේ නැති නිසා උසාවියට යන්නේ නැත්තේ. අනිත් පාර්ශවය ප්‍රාදේශීය සභාව. මට ඒක ඉවර කරලා දෙන්න.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සහ ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් සභාපතිතුමා දිගින් දිගට කියනවා සල්ලි ඇවිල්ලා කියලා. ඔබතුමාලා ගිහින් කරලා දෙන්න ඕන වැඩක් මේක. අරලියවත්තට සල්ලි ඇවිල්ලා තියෙන්නේ. ඇයි පාරේ තියෙන ගහ ඉවත් කරගන්න බැරි. කපලා අයිනට දාන්න. සභාවෙන් කපලා පැත්තකට දාන්න. මේ වැඩේ මෙහෙම වෙනකොට මනුස්සයො විදියට තරහ යනවනේ. ඒකෙ අයිතිය ගැන එක එක කතා කියනවා. දැන් මාස 03 ක් විතර වෙනවා මේ සිද්ධියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රාදේශීය ලේකම්තුමා එවපු ලියුම ඔබතුමා දැක්කද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක හරි. කපන්න තහනමක් නැනේ. අපිට තියෙන්නේ ගහ මිලදී ගනිපු කෙනා ගන්නේ නැත්නම් කපලා පැත්තකට දාන්න. ප්‍රාදේශීය ලේකම්ට ප්‍රවාහනයට අවසර දෙන්න බැරි හේතුව මොකද්ද?. එයා මොකද කියන්නේ?. එයා ප්‍රවාහනය කරන්න දෙන්නේ නැතිව ගහ කපන්නත් දෙනවා නම් ඒක අහන්න ඕන ඔබතුමා. ඔබතුමා අහන්න ප්‍රාදේශීය ලේකම්තුමාගෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තව නඩුවක් තියෙනවා කියලා කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තව නඩුවක් ඇත්තේ නෑ.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ප්‍රවාහනය දෙන්න බැරි හේතුව අහන්න. පාර උසාවියෙන් දීලා තියෙන්නේ. ඔබතුමාට බැරිනම් මම කතා කරන්නම් ප්‍රාදේශීය ලේකම්තුමාට.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තව නඩුවක් තියේ කියලා කියනවා ප්‍රාදේශීය ලේකම්තුමා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කමිටු තීන්දුවක් අරන් කපන්නත් බැනේ. කමිටුවලටත් ඔබතුමාලා විරුද්ධයිනේ. නීත්‍යානුකූල නෑ කිවුවොත්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා හැම එකටම මේක ගාවගන්න එපා.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** අපිත් එක්ක එකතුවෙලා පරණ විදියටම කමිටු කරන්න එනවනම් අපි සහභාගී වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගහ කපලා ඉවරවෙලා තියලා එන්න බැනේ. එතන තිබිලා නැති වුනොත්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඕක උස්සන් යන්න බැනේ කාටවත්.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ග්‍රාම සේවකට ගහ භාර දෙන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඇයි කපන්න දුන්නේ, ප්‍රවාහනයට අවසර දුන්නේ නැත්නම්?.

(සභාව පැහැදිලි නොවීය)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒකට මෝෂන් එකක් දාමු. දැන් සභා තීන්දුවක් ගමු.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම යෝජනාවක් ගේනවා ඒක අත්‍යවශ්‍ය කටයුත්තක් සේ සලකන්න. අරලියගහ වත්ත මාර්ගය ඉදිකිරිමට අවහිර පොල් ගහ සහ කොස් ගහ ඉවත් කරන්න මෝෂන් එකක් මාර්ගයෙන් ඉදිරි කටයුතු කරන්න. ඒ පාර බොහොම නීත්‍යානුකූලව වෙන්වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ වගේම තමයි ඒක සවුත්ලන්ඩ් විද්‍යාලයේ විනෝද බද්දට ගේන්න බැරිවුනා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** විනෝද බද්ද වගේ නෙමෙයි මේක. විනෝද බද්ද කියන්නේ මෙතන දීර්ඝ කාලෙක ඉදන් කරපු දෙයක්. මේක අත්‍යවශ්‍ය කාරණයක්නේ.

මීළඟ මහා සභා රැස්වීම 2019.02.18 වන සඳුදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදි.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව